
# දැයක් යනු භූමියට වැඩි දෙයකි



බැසිල් ප්‍රනාන්දු

# දැයක් යනු භූමියට වැඩි දෙයකි

# දැයක් යනු භූමියට වැඩි දෙයකි

පෙර පරපුරේ නීතිඥයෙකු විසින් පසු පරපුරක්
වෙනුවෙන් ලියන ලද ලිපියකි

නීතිඥ බැසිල් ප්‍රනාන්දු

විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

දැයක් යනු භූමියට වැඩි දෙයකි
පෙර පරපුරේ නීතිඥයෙකු විසින් පසු පරපුරක් වෙනුවෙන්
ලියන ලද ලිපියකි

(c) නීතිඥ බැසිල් ප්‍රනාන්දු

ප්‍රථම මුද්‍රණය : 2017

ISBN - 978 - 955 - 691 - 255 - 5

මුල් කවරයේ චිත්‍රය : ජ්‍යෙෂ්ඨ පීටර් බරුජල් විසින් 1563 දී
අඳින ලද බාබෙල් කුලුන

පිට වැස්ම : පුෂ්පානන්ද ඒකනායක

පරිගණක පිටු සැලසුම : පුෂ්පානන්ද ඒකනායක
'ද ෆොන්ට් මාස්ටර්'
45/96, නාවල පාර,
කොළඹ 05.
(පොනිති 12 අභය ෆොනුරුවෙනි.)

මුද්‍රණය : විජේසූරිය එන්ටර්ප්‍රයිසස්
නො. 350/2,
හිඹුටාන පාර,
අංගොඩ.

ප්‍රකාශනය : **විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය**
812, මරදාන පාර,
පුංචි බොරැල්ල.
දුරකතනය : 2696675

# පිදුම

*දැය මුහුණ දුන් අඳුරුතම දශකයන් තුළ දැයේ අනාගතය ගැන*
*බලාපොරොත්තු නැති කර නොගත්,*
*අනාගතය කෙරේ සිය යුතුකම් අමතක කිරීම ප්‍රතික්ෂේප කළ*
*සියල්ලන් වෙත මේ කෘතිය පිදේ.*

# පටුන


| | |
|---|---|
| සංස්කාරකගේ සටහනක් | 09 |
| අවුරුදු 25 කට පසු | 11 |
| ගිනි කන්දක් මතුවී දැවෙන කාලයක් | 14 |
| බලපුළුවන්කාරයන් මැඬලීම | 17 |
| දැයක ඉතිහාසය | 22 |
| සංවිධාන රටාව | 26 |
| ආරක්ෂකයෝ | 30 |
| උත්පත්තිය හා කැමැත්ත | 35 |
| සොරකම් මැඬලීම | 40 |
| මංකොල්ලකරුවන්ගේ පාරාදීසයක්? | 44 |
| අරුත් වියවුල් කරන භාෂා අවුල | 47 |

# සංස්කාරකගේ සටහනක්

මේ ලේඛනය මා අතට පත් කරන ලද්දේ මගේ හිතවත්, වෘත්තීයමය වශයෙන් ගුරුවරයෙකු වූ සුප්‍රසිද්ධ නීතිඥවරයෙකු විසිනි. එතුමාගේ කාලයේ දී රට පුරා ප්‍රසිද්ධියක් දැරූ දක්ෂ නීතිඥයෙකු මෙන් ම, නීතිය පිළිබඳ දර්ශනවාදය ගැන ද හසළ දැනුමක් එතුමාට තිබුණේ ය. එතුමා දැන් ජීවතුන් අතර නැත. එතුමාගේ ජීවිතයේ අවසාන කාලය ඉතා දැඩි කලකිරීමකින් සිටි බව මම දනිමි.

මේ ලේඛනය එතුමා මා අතට පත් කළේ එතුමාගේ මරණයට පෙර ය. එතුමා එය ලියා තිබුණේ 1982 වර්ෂයේ අග භාගයේ දී පමණ ය.

එතුමා මගෙන් ඉල්ලා සිටියේ අවුරුදු 25 ක කාලයක් යන තුරු මේ ලේඛනය කා අතටවත් පත් කළ නොයුතු බවත්, කෙසේ වුවත් එය ප්‍රසිද්ධ කළ යුතු වන්නේ ඒ කාලයෙන් පසු ව බවත් ය.

මා විසින් එතුමාට දෙන ලද පොරොන්දුව අනුව මා මේ ලේඛනය දැන් ප්‍රසිද්ධියට පත් කරන්නේ, එතුමා බලාපොරොත්තු වූ ආකාරයට මතු පරපුරකට එතුමා විසින් ලියන ලද ලිපියක් වශයෙනි.

මේ පිළිබඳ ව මා විසින් මීට වඩා කිසිවක් නොකීම සුදුසු යැයි සිතන්නේ සුපුරුදු ලෙස එතුමා තමාගේ අදහස් ඉතා පැහැදිලි ව ප්‍රකාශයට පත් කොට ඇති නිසා ය.

**සංස්කාරක**

# අවුරුදු 25 කට පසු

මේ සටහන ලියන්නේ අනාගත පාඨකයෙකු සඳහා ය. මේ සටහන තව අවුරුදු 25 කට පසු ව පමණක් ප්‍රසිද්ධියට පත් කරන ලෙස මා විසින් නිර්දේශ කොට ඇත. ඒ අනුව මම මෙය ලියන මොහොතෙත් අවුරුදු 25 කට පසු මෙය කියවන පාඨකයා පිළිබඳ ව යම් අදහසක් මා තුළ ඇත. ඒ අදහස නම් මා විසින් මෙහි ලියන බොහෝ කරුණු ඒ පාඨකයාට තේරුම් ගැනීමට විශාල අපහසුවක් පවතිනු ඇත යන්න ය. මා එසේ කියන්නේ අවුරුදු 25 කින් පසු එන කාලය ගැන හිතා ගැනීමට අපහසු බව කීම සඳහා නොවේ. ඇත්තෙන් ම එහි විරුද්ධාර්ථය කීම සඳහා ය. අවුරුදු 25 කට පසු මෙය කියවන පාඨකයා සම්බන්ධයෙන් මම බොහෝ දේ දනිමි. මා එසේ දන්නේ කිසියම් පෙරනිමිති කීමේ හැකියාවක් මා තුළ තිබෙන නිසා නොව, මගේ වෘත්තීය පුහුණුවෙන් ම මම තර්කානුකූල ව සිතීමට පුහුණු කරනු ලැබූ පුද්ගලයෙකු වන නිසා ය.

මා නීති අධ්‍යාපනය කරා මෙහෙයවුණේ මේ ලියන මොහොතට අවුරුදු 45 කට වඩා ඇත අතීතයක දී ය. ඒ කාලය තුළ නීතිය හා නීතිඥයා පිළිබඳ ව පුළුල් ව පිළිගැනුණු ප්‍රතිරූපයක් තුබුණේ ය. මා ද ඒ ප්‍රතිරූපය තුළින් නිර්මාණය වූ පුද්ගලයෙක්මි.

මේ ලිපිය කියවන පාඨකයාට මේ කරුණ අවබෝධ කර ගැනීමට නොහැකි වනු ඇති බව මම දනිමි. මන්ද යත් මා ජීවත් වූ හා ක්‍රියාකාරී ව සම්බන්ධ වූ සමාජය තුළ නීතිය ගැන මෙන් ම නීති වෘත්තීය පිළිබඳ පැවති අදහස් මෙය කියවන පාඨකයාගේ කාලය වන විට කාටවත් තවදුරටත් වටහා ගැනීමට බැරි අදහස් වනු ඇති බව ම හුදෙක් අනුමාන කරනවා නොව, මා හොඳින්

දනිමි. එසේ දන්නේ මාගේ පුහුණුව හා කල්පනා කිරීමේ දී මා ගන්නා නිගමනයන් නිසා ය.

මේ 1982 වර්ෂයයි. මගේ වෘත්තීය ජීවිතයේ අතිශයින් ම අඳුරු කාලය මේ වන විට ගොඩනැඟී හමාර ය.

ජනමත විචාරණයක් මඟින් මීට අවුරුදු 6 කට පමණ පෙර පත් කර ගන්නා ලද පාර්ලිමේන්තුවේ සාමාජිකයන්ට, තවත් අවුරුදු 6 ක කාලයක් තමන්ගේ වෘත්තීය ජීවිතය දික්කර ගැනීමට හැකි වූ ඒ අඳුරු දිනය දකින්නට ලැබුවන් අතර මම ද එක් අයෙක්මි.

මගේ වෘත්තීය අනාගතය මා දකින්නේ මෙවෙනි සිද්ධීන් ගණනාවක් තුළිනි. මා ජීවත්වීමට පුරුදුව සිටි ලෝකය වෙනස් වී යන හැටි හොඳින් ම දැක, එය තුළින් විඳින බුද්ධිමය දෙදරුම් කෑමට මා ද ලක්වූ පුද්ගලයෙක්මි.

මා නීතිඥයෙකු යනුවෙන් මීට පෙර පුරුදුව සිටි ලෝකය තුළ තිබූ ප්‍රතිරූපය දළ වශයෙන් ඔබට කියන්නට උත්සාහ කරමි. තමන් ඉදිරියට ඉදිරිපත් කරනු ලබන කිසියම් සිද්ධි මාලාවක් නීතිය හා නීතියට පදනම් වන දර්ශනවාදය තුළින් කල්පනාවට ලක්කොට ඒ මඟින් තර්කානුකූල ව බැස ගත යුතු නිගමනවලට එළඹීම සඳහා පුහුණුවක් තිබූ පුද්ගලයෙකු ලෙස මාගේ කාලයේ සිටි නීතිඥයා හැඳින්විය හැකි ය. මෙයින් අදහස් වන්නේ සියලු ම නීතිඥයන් එසේ වූවා යයි යන්න නොවේ. එයින් අදහස් වන්නේ වෘත්තිය පිළිබඳ ව පැවති මූලික සංකල්පය එය බව ය. මා වැන්නන් ඒ සංකල්පය තරුණ කාලයේ දී වැලඳගෙන ඉන් පසු ඒ සංකල්පය ඔස්සේ ගමන් කිරීම හා එය උපරිම ආකාරයෙන් සාක්ෂාත් කර ගැනීම අරමුණු කොටගත් පුද්ගලයෝ වීමු. ඇත්තෙන් ම මගේ වෘත්තීය ජීවිත කාලය තුළ මා ලැබූ සියලු ම බුද්ධිමය ජයග්‍රහණයන් තුළ අත්පත් කර ගත් දේ පිළිබඳ ව සෑහීමකට පත්වීමත්, මේ නිසා මා විසින් අත්පත් කර ගත් සමාජයේ කීර්තිනාමය මෙන් ම මා උපයා ගත් මුදල් හා ඒ අනුව හැඩගැසුණු මගේ ජීවිත කාලයන් සියල්ලක් ම පදනම් වී තිබුණේ ඉහත කී සංකල්පය අනුගමනය කිරීමේ දී මට තුබූ සාර්ථක භාවය නිසා ය. එසේ සාර්ථක වූ බොහෝ දෙනෙකුගේ

නායකත්වය යටතේ මේ වෘත්තිය පැවතියේ ය. මා ඔබට කීමට අදහස් කරන්නේ මේ සියල්ලන් හොඳ මිනිසුන් හෝ නරක මිනිසුන් වශයෙන් වර්ගීකරණය කිරීම සඳහා නොවේ. වෘත්තියක් පිළිබඳ ව තිබෙන සංකල්පය හොඳ නරක පිළිබඳ ව පවතින සංකල්පයක් නොවේ. එය වෘත්තියේ සම්ප්‍රදායන්, වෘත්තියේ අභිමතාර්ථයන්, වෘත්තිකයන් විසින් ඉටු කරන සමාජ කර්තව්‍ය ආදි කර්තව්‍යවලින් නිගමනය වන රටාවකි. ඒ රටාවේ සාර්ථක ව යෙදීම වනාහි, වෘත්තියට අදාළ ඒ කරුණු හොඳින් කිරීම පමණක් ම මත රැඳෙන අතර, ඒ පුද්ගලයා ඒ නිසැක ව ම හොඳ පුද්ගලයෙක් ද නැද්ද යන්න පිළිබඳ ව මෙහි දී සාකච්ඡා කිරීමට මම බලාපොරොත්තු නොවෙමි.

* * * *

# ගිනි කන්දක් මතු වී දැවෙන කාලයක්

යුක්තිය, නීතිය, අපරාධය, දඬුවම, අපරාධ පරීක්ෂකයා, රජය වෙනුවෙන් නඩු පවරන්නා හෙවත් නීතිපතිවරයා, විනිශ්චකාරවරු, නඩු විභාගය, නඩු තීන්දුව, අභියාචනය, හරයාත්මක නීතිය හා නීති විධිවිධාන, නීති ක්‍රියාවට යෙදවීම ආදි වචන සම්බන්ධයෙන් මා ජීවත් වූ කාලයේ පැවති අරුත් හා ඔබ ජීවත් වන කාලයේ ඒ වචනවලට ආරූඪ වී ඇති අරුත් කොයි ආකාරයටවත් එකිනෙකට සමාන නොවන බව මම දනිමි. ඔබ කවුදැයි ඔබ හඳුන්වා ගන්නා ආකාරය මාගේ කාලයේ ජීවත් වූ අයෙකු වශයෙන් මා කවුදැයි මා හඳුනා ගත් ආකාරයත් අතර කිසිදු හෝ සමානකමක් නොතිබෙන බව ද මම දනිමි.

මා මේ ලේඛනය ලියන්නට තීන්දු කළේ ඒ කරුණ ම නිසා ය.

මා ලියන මේ ලේඛනය අවුරුදු 25 කින් පසුව පමණක් එළිදැක්විය යුතු යැයි මා නිර්දේශයක් කරන ලද්දේ මොන හේතුවක් නිසා දැයි ඔබ තුළ කුතුහලයක් ඇති වනු ඇත. එය සාධාරණ කුතුහලයකි. ඒ නිසා මා එසේ කළේ ඇයි ද යන්න ගැන යම් පැහැදිලි කිරීමක් කළ යුතු ය.

එය වඩාත් ලෙහෙසියෙන් කළ හැක්කේ උදාහරණයක් මඟිනි. ගිනි කන්දක් මතු වී ඇවිළෙන්නට පටන් ගත්තා යැයි සිතමු. මේ ඇවිළීම කාලයක් පුරා ම පවතිනවා ඇත. ඒ කාලය තුළ දී ඒ පිළිබඳ ව කිසිවක් කිරීමට කාටවත් බැරි ය. කළ හැකි එකම දෙය නම් ගිනි කන්ද ඇති තැනින් ඈත් වීම පමණ ය.

ගිනි කන්දට අවශ්‍ය කාලය ගෙවා එය ස්වභාවිකව අවසන් වන කාලයක් උදා වන බව කාට වුවත් සිතා ගත හැකි ය.

එහෙත් එසේ වෙනතාක් පවතින තත්ත්වය සම්බන්ධයෙන් කිසි වෙනසක් ඇති කිරීමට කාටත් බැරි ය.

එවැනි තත්ත්වයක සිටින්නෙකුට කළ හැකි එකම දෙය නම් තමන් ජීවත් වූ කාලය තුළ තමන් දැන උගත් හා දුටු දේ පිළිබඳ ව යම් මතකයක් ලියා තැබීම ය. ගිනි කන්ද නිවුණු දිනයක නැවත ඒ ප්‍රදේශයට ළඟාවන්නන්ට එවැනි ලියවිල්ලකින් යම් ප්‍රයෝජනයක් තිබෙන්නට ඉඩ ඇත.

දැන් අප සිටින්නේ ද එවැනි අවධියක ය. ගිනි කන්දකට සමාන සමාජ ව්‍යසනයකට අපි මුහුණපා සිටිමු. එය යාම්තමින් ප්‍රකාශයට පත් වන අවස්ථාවේ දී, එය මඟහරවා ගත හැකි යැයි සමහරු සිතූහ. මා ද තරමකට එසේ සිතූ බව කීමට මැළි නොවෙමි. එහෙත් ක්‍රමයෙන් ගිනි කන්ද පුපුරා ගියේ ය. අද හෙට එය නිවී ඉවර වනු ඇතැයි සමහරුනට හිතුණොත් එය ද ස්වභාවික ය. එහෙත් ගිනි කන්දක ස්වභාවය දන්නෝ එවැනි වෙනසක් ඉක්මනකින් සිදු නොවනු ඇති බව හොඳින් දනිති. මේ වන විට රටේ ව්‍යසනය ළඟා වී ඇති තත්ත්වය දෙස බලන විට එය නොතකා හිඳීමට හෝ ඉක්මනින් එය මැකී යනු ඇතැයි සිතීමට කිසිදු තර්කානුකූල පදනමක් නැත.

එවැනි තත්ත්වයක් යටතේ කළ හැකි එකම දෙය නම් අතීතය පිළිබඳ ව යම් මතකයක් සටහන් කර තිබීම පමණ ය. මා මේ කුඩා ලේඛනය මඟින් කරන්නේ එවැනි කටයුත්තකි. මා ලියන මේ ලේඛනය මා ජීවත් වන කාලයේ කිසිවකුට අවශ්‍ය ලේඛනයක් නොවනු ඇත. එහෙත් අනාගතයේ කාට හෝ එයින් යම් සෙතක් වීමට පුළුවන.

අතීතය පිළිබඳ ව තබන සටහනකට අනාගතය වෙනස් කළ නොහැකි ය. එය මම හොඳින් දනිමි. ඔබ ජීවත් වන ලෝකය මා ජීවත් වූ ලෝකයට සමාන කිරීමට කිසිදු උවමනාවක් මට ඇත්තේ නැත. මා ජීවත් වූ ලෝකය ද අංග සම්පූර්ණ වූ ලෝකයක් නොවේ. එය බොහෝ අඩුපාඩුවලින් පිරි ලෝකයකි. ඒ ලෝකය ඒ හැටියෙන්ම නැවත ප්‍රතිනිර්මාණය කිරීම සඳහා යමෙකු ප්‍රයත්නයක යෙදීමට උනන්දු කරවීම මා මේ ලේඛනය ලිවීමට උසි ගැන්වූ හේතුව නොවේ.

මා ලියන්නේ එක්තරා සටහනක් පමණ ය. එයින් ඔබට හා ඔබගේ කාලයේ ජීවත් වන අයට කිසියම් සේවයක් වනු ඇතැයි මම බලාපොරොත්තු නොවෙමි. එහෙත් ගිනි කන්දක් ඇති වී එය ව්‍යාප්ත වෙමින් පවතින කාලයක මා වැන්නෙකුට කළ හැකි එකම දෙය නම් මා ජීවත් වූ කාලය පිළිබඳ යම් සටහනක් ඉතිරි කිරීම පමණ ය. එය කොයි ආකාරයකින් කාට හෝ කවදා හෝ යම් ප්‍රයෝජනදායක භාවයක් ඇති කරාවිය යන්න සාධාරණ ව ඇති කර ගත හැකි බලාපොරොත්තුවක් නොවේ.

* * * *

# බලපුළුවන්කාරයන් මැඩලීම

මා ජීවත් වීමට පුරුදුව සිටි ලෝකයේ නීතිඥ ප්‍රජාව අතර නිර්භීතකම හෙවත් අභීත බව පිළිබඳ ව අදහසක් තිබුණේ ය. වෙනත් ආකාරයකින් කිවහොත් නිවටකම හා බියගුලුකම පිළිබඳ ව ඉතා පැහැදිලි අදහසක් එදා පැවතියේ ය.

නිර්භීතකම වශයෙන් එදා සලකන ලද්දේ මොන බලවතෙක් හෝ නීතිය කඩා වරදක් කරයි නම් එසේ කිරීම නතර කිරීමේ හැකියාවක් තමන්ට තිබෙන බව නීතිඥයින් විශ්වාස කළ අතර, එසේ කිරීමේ යුතුකමක් ද ඔවුන් වෙත පැවරී තිබෙන බව ද ඔවුහු තරයේ විශ්වාස කළහ. වෙනත් ආකාරයකින් කියහොත් යම් බලපුළුවන්කාරකමකට යටත් වී නීතියක් කඩා වරදක් කරන අය නතර කිරීමට ඉදිරිපත් නොවීම නිවටකමක් වශයෙන් පොදුවේ පිළිගැනීමක් පැවතිණි. නිවටකම හා නීතිඥ වෘත්තියට එකට පැවතිය නොහැකිය යන අදහස ද තරයේ පැවතියේ ය.

බලපුළුවන්කාරයා ආණ්ඩුවක් වීමට පුළුවන. ඇත්තෙන් ම වැඩිම වශයෙන් තම බලපුළුවන්කාරකම පාවිච්චි කර ගෙන නීතිය කඩා හෝ තමන්ගේ අභිමතය ඉටු කර ගැනීමේ වැඩි ආශාවක් හා උනන්දුවක් ඇත්තේ ආණ්ඩුවලට ය. ඒ නිසා විශේෂයෙන් ම ආණ්ඩු බැඳ තැබීමේ අවශ්‍යතාවක් ඇතැයි යන්න පිළිබඳ ව විශ්වාසයක් පැවතියේ ය. පාලනය කළ නොහැකි මුරණ්ඩු හිතුවක්කාරයෙකු දම්වැලකින් හෝ කඹයකින් ගැටගසා ගසක හෝ වෙනත් තැනක බැඳ තබනවා මෙන් ආණ්ඩුවක මුරණ්ඩුකම් ද මැඩලිය යුතුය යන්න පිළිබඳ විශ්වාසය එදා පැවති විශ්වාසයන් අතර ඉතාමත් ම බලවත් විශ්වාසයක් විය.

එසේ බැඳ තැබීමේ කර්තව්‍යයට ඉදිරිපත්වීමත්, ඒ පිළිබඳ ව සියලු ම බුද්ධිමය ශක්තිය යොදා ඒ කර්තව්‍යය සාර්ථක ව කිරීමත් දක්ෂ නීතිඥයෙකුගේ ලක්ෂණය විය. මේ සඳහා ඔහුට ආධාර උපකාර වන නීති සම්ප්‍රදායක් පැවතියේ ය. ඒ නීති සම්ප්‍රදාය තුළ යමෙකුට එනම් ආණ්ඩුවක් ඇතුළු ඕනෑ ම කෙනෙකුට කිරීමට ඉඩකඩ නැති දේ පිළිබඳ ව ඉතා පැහැදිලි ප්‍රකාශනයක් තිබුණේ ය. නීතිඥයාගේ යුතුකම වූයේ නීතියෙන් නිර්මාණය කොට තිබූ දම්වැල රැගෙන ගොස් ඒ දම්වැලින් හිතුවක්කාර හා මුරණ්ඩු බලවතා බැඳ තැබීම පිළිබඳ ව නියෝගයක් අධිකරණයකින් ඉල්ලා සිටීම ය.

මේ අනුව මා පුරුදුව සිටි ලෝකය තුළ අධිකරණයට මහා බලපුළුවන්කාරකමක් හිමි ව තිබුණේ ය. නීතියක් කඩා වරදක් කරන ආණ්ඩුවක් හෝ වෙනත් කිසිම බලවතෙකු සිටින බව අධිකරණයේ අවධානයට පත් වූ විට ඒ බලවතා වහා බැඳ තබා ඔහු කරන්නට යන වැරදි වැඩය නතර කිරීමේ බලය අධිකරණයට තිබුණේ ය.

ඒ අධිකරණ බලය පාවිච්චි කිරීමට අවශ්‍ය වූයේ එක් දෙයක් පමණ ය. එනම් යම් පුරවැසියෙකු තමන් ම හෝ බොහෝ විට නීතිඥයෙකුගේ මඟින් ඉදිරිපත් වී කෙරෙමින් තිබූ හෝ කෙරෙන්නට යන නීත්‍යනුකූල නොවන වැරැද්ද අධිකරණයකට පෙන්වා දීම ඒ ප්‍රධාන කොන්දේසිය විය. එසේ පැමිණි අයෙකු හරවා ඇරීමේ බලයක් අධිකරණයට තිබුණේ නැත. අධිකරණය ශිෂ්ට සමාජය පදනම් වී තිබූ බලවත් සම්ප්‍රදායයන්ගෙන් බැඳී සිටියේ ය. හිතුවක්කාරකම අධිකරණයකට හිමි වූ අංගයක් නොවී ය. අධිකරණය ක්‍රියා කළ යුතු වූයේ නීතිය හා නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා පනවා තිබූ විධිවිධාන ඔස්සේ ය.

මේ අනුව නීතිඥයා අධිකරණයක් ඉදිරියට ගොස් කියා සිටින කරුණු දෙකක් ඇත. එකක් නම් නීතිය කඩා යම් වරදක් යම් බලපුළුවන්කාරයෙකු විසින් කරමින් තිබෙනවා හෝ කරන්නට යනවා යැයි පෙන්නුම් කිරීමට කරුණු ඔහු සතු විය යුතු විය. දෙවැන්න නම් ඒ කරුණට අදාළ නීතිය පිළිබඳ ව පරිණත දැනීමකි. මේ කරුණු දෙක හැරෙන්නට ඔහු සතු විය යුතු මූලික

ගුණාංගය විය යුතු වූයේ බියෙන් තොර ව හා කිසිම ප්‍රතිලාභයක් පිළිබඳ පොරොන්දුවකට හිස නොනමා අව්‍යාජව තමන් පැමිණි කාරණය අධිකරණයට පැහැදිලි ව කියා පෑම ය.

අධිකරණය මෙවැනි අවස්ථාවල දී හුදෙක් ම එක් පාර්ශ්වයකින් කෙරෙන ඉල්ලීමක් මත හෝ කරුණු කීමක් අනුව ක්‍රියා නොකරයි. එය අදාළ විරුද්ධ පාර්ශ්වකාරයාට, අධිකරණය ඉදිරියට පමුණුවා ඇති කරුණ හෙවත් පැමිණිල්ල දැනුම් දී ඊට විරුද්ධ ව යමක් කීමට තිබෙනවා ද යන්න පිළිබඳ ව අධිකරණය ආමන්ත්‍රණය කිරීමට අවස්ථාවක් විරුද්ධ පාර්ශ්වයාට හෝ ඔහුගේ නීතිඥයාට ලබා දෙයි. මෙතැන දී විරුද්ධ පාර්ශ්වයේ නීතිඥයා ද අභීතව හා කිසිම ප්‍රතිලාභයක් ලැබීමේ අභිලාෂයකට හිස නොනමා තමන් කියන කරුණු ද අංග සම්පූර්ණව අධිකරණයට කියනු ඇතැයි යන බලාපොරොත්තුව ද එදා පැවතියේ ය.

අධිකරණයක් ඉදිරියේ බුද්ධි හරඹයක යෙදීම නීතිඥයින්ගේ යුතුකම විය. ඔවුන් පාවිච්චි කළ ආයුධය වූයේ තර්කානුකූල භාවයයි. තර්කයක් හා තවත් තර්කයක් අතර ඇති වන ගැටුම් වනාහි මනුෂ්‍ය වර්ගයාට දැක ගත හැකි අතිශයින් ම ආකර්ෂණීය වන දෙයකි. දිනපතා ම මෙවැනි හරඹයන් අධිකරණ ගණනාවක් ඔස්සේ සිදු විය. මේ තර්ක හරඹය රටේ බුද්ධිමය දක්ෂතාවයේ ප්‍රකාශනයක් විය.

ඒ බුද්ධිමය දක්ෂතාවයේ උපරිම මල් පෙත්ත වූයේ සියලු තර්කයනට ඇහුම්කම් දී නීතිමය රාමුව තුළ ඒ තර්කවල හරි වැරදි සොයා බලා නිගමනයට ඒමට අධිකරණයට තිබූ හැකියාව ය. අධිකරණය ද කිසිම බලවතෙකුට හිස නොනමන තැනැක් විය. නීතිය හා බුද්ධියේ මඟපෙන්වීම යටතේ පමණක් නිගමනයට පැමිණීමේ උවමනාවත් හැකියාවත් අධිකරණවලට තිබුණේ ය. මෙය කොච්චර ලස්සණ දෙයක් ද?

අපි උදාහරණයක් ගෙන මෙය සිදු වූ ආකාරය දෙස බලමු. බ්‍රේස් ගර්ඩල් නමැති තරුණ ඔස්ට්‍රේලියානු වැවිලිකරුවෙකු ලංකාවට පැමිණ වැවිලි කර්මාන්තයේ යෙදී සිටියේ ය. යුක්තිය පිළිබඳ ව දැඩි උනන්දුවක් දැක්වූ මේ පුද්ගලයා ලංකාවේ කම්කරුවන් වෙනුවෙන් සටන් කළ සමසමාජ පක්ෂයේ

අනුගාමිකයෙකු හා සහාය දක්වන්නෙකු බවට පත් විය. මෙය එදා සිටි විදේශික වැවිලිකරුවනට මහත් හිසරදයක් විය. ඔහු රටෙන් පලවාහරින ලෙස වැවිලිකරුවන් කරන ලද ඉල්ලීමක් අනුව ඔහු නැවක නග්ගා රටින් පිටුවහල් කරන ලෙසට එදා සිටි ආණ්ඩුකාරයා නියම කළේ ය.

මේ අවස්ථාවේ දී රටේ සිටි නීතිඥයින් අතර ඉතාමත් කැපී පෙනෙන දීප්තිමත් තරුවක් වූයේ එච්. වී. පෙරේරා නමැති රාජ නීතිඥයා ය. ඔහු මේ පෙරළිකාර වැවිලිකරුවා වෙනුවෙන් ඉදිරිපත් විය. ඔහු ඉහළම අධිකරණය ඉදිරියේ පෙත්සමක් යොමු කරමින් ආණ්ඩුකාරයාගේ නියෝගය නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලා සිටියේ ය. මේ පිළිබඳ ව සියලු ම තර්ක විතර්ක ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ඉදිරිපත් කරනු ලැබිණි. ශ්‍රේෂ්ඨාධිකරණයේ මුලසුන ගත් බ්‍රිතාන්‍ය ජාතික විනිසුරුකර තුමන් නියෝග කළේ ආණ්ඩුකාරයාගේ නියෝගය නීති විරෝධි නිසා ඒ නියෝගය තමන් විසින් නිෂ්ප්‍රභා කර දමනු ලබන බව ය. පුද්ගලයන්ගේ ආරක්ෂාව පිළිබඳ අවසාන වචනය අධිකරණයට හිමි විය යුතු බව ඔහු කියා සිටියේය. ඒ අනුව ලංකාවේ තවදුරටත් රැඳී සිටීමට බ්‍රේස් ගර්ඩල් මහතාට අවසරය ලැබුණේ ය. මෙය කොපමණ දීප්තිමත් දිනයක් ද? සමාජයක ශිෂ්ට සම්පන්න භාවය මීට වඩා ඉහළින් ප්‍රකාශයට පත් කිරීමට වෙනත් ක්‍රමයක් පවතී ද? ඇත්තෙන් ම නැත.

සැම නීතිඥයෙකුගෙන් ම සැම විනිසුරුවරයෙකුගෙන් ම එදා බලාපොරොත්තු වූයේ මේ නඩුව තුළ දකින්නට ලැබූ ප්‍රභාවත් භාවයෙන් ම කටයුතු කිරීම ය.

මා මේ ලියන 82 වර්ෂයේ ජනමත විචාරණය මඟින් ප්‍රකාශයට පත්වන්නේ ඉහත සඳහන් කරන ලද ප්‍රභාවත් භාවය මේ රට තුළින් ඉතා තීරණාත්මක ව වියෝ වෙමින් පවතින බව ය. එක්තරා කාලයකට ඡන්ද බලයෙන් පත්වීමක් ලැබූ මන්ත්‍රීවරුන් ජනමත විචාරණයක් යැයි අටවා ගත් බොරුවක් මඟින් තම කාලසීමාව දික්කර ගැනීම තරම් බුද්ධියට නිගා දෙන තවත් දෙයක් තිබිය හැකි ද?

එහෙත් අද මා මෙන් ම අනෙක් නීතිඥ ප්‍රජාව ද මේ සියල්ල දෙස බලමින් විරවා ගෙන සිටින නමුත් ඔවුන්ට කළ හැකි දෙයක් නැත. නිර්භීත භාවයට තිබූ ඉඩකඩ එසේ අහෝසි වී ගොස් ඇත. අප සියල්ලන් ම දැන් නිවටයන් බවට පත් වී ඇත.

ඉදිරි අවුරුදු 25 ක් තුළ සිදුවන්නේ මේ නිවට භාවය වඩ වඩාත් රට පුරා ම මුල්බැස ගැනීම ය. පෙර සේ ම නීතිඥයින් කළු කොට් හා ටයි පටි බැන්දත් බාහිර රූපයෙන් එදා සිටි නීතිඥයින්ට සමාන වුවත්, හරයෙන්ම ඔවුහු වෙනත් වර්ගයක් වෙති. නීතියේ හා බුද්ධියේ යුගය මෙසේ අවසන් වෙමින් පවතී.

මෙය කියවන ඔබ උරුම කර ගෙන ඇත්තේ එවැනි නිවටකම අගතැන්පත් ලෝකයකි.

* * * *

# දැයක ඉතිහාසය

ඔබ මෙය කියවන කාලය වන විට ඉතිහාසය පිළිබඳ අදහසක් ඔබ සමාජය තුළ නොපවතිනු ඇතැයි මම සිතමි. එහෙත් අප ජීවත් වූ වඩා සාරවත් කාලය තුළ ඉතිහාසය පිළිබඳ ව අදහසක් අපට තිබුණේ ය. ඒ අදහස මිථ්‍යාවත් බවට පත් වනු ලැබීම යමෙකුගේ ජීවිතයේ අග කාලයේ දී විඳින්නට වන විශාල දුකකි. කෙසේ වුවත් යම් සිදුවීම් ධාරාවක් විසින් ඒ කටයුත්ත මේ වන විටත් සිදු කොට ඇති අතර, ඉදිරි අවුරුදු 25 කාලය තුළ බොහෝ අය එවැනි අදහසක් තිබුණාය යන්න ගැන පවා සැක කරනු ඇත.

ඉතිහාසය පිළිබඳ අපට තිබූ විශ්වාසය රැඳී තිබුණේ දැයක් (The Nation) යන අදහස හා අපි එක් දැයක කොටස් කාරයන්ය යන අදහස මත ය. එදා පැවති ඒ අදහස මම කෙටියෙන් විස්තර කිරීමට උත්සාහ කරමි.

දැයක් යනු දෙයක් නොවේ. බොහෝ විට එය හුදු භූමි භාගයක්ය යන අදහස සමහරු ඇති කර ගනිති. අපි යම් භූමි භාගයක් තුළ ජීවත් වන නිසා ම අපි දැයක කොටස්කරුවන් යැයි සමහරු සිතති. ඒ අදහස පසුපස ඇත්තේ දැයක් යනු දෙයක්ය යන අදහස ය.

එක්තරා ජන කොට්ඨාසයක් දැයක් බවට පරිවර්තනය වීම සිදුවන්නේ ඔවුන් තුළ පොදුවේ පිළිගැනෙන අවබෝධයක් හා බැඳීමක් ඇති වීමත් සමඟ ය. මේ අවබෝධය මඟින් වෙන් වෙන්ව ජීවත් වන මිනිසුන් හා ගැහැනුන් අතර 'මා' යන සංකල්පය අභිභවා 'අප' යන සංකල්පය වර්ධනය වීමක් සිදු වේ. මෙය අතිශයින් ම අමාරු කාර්යයකි.

මෙයින් අදහස් වන්නේ මා යන සංකල්පය නැති වී යෑමක් නොවේ. මා යන සංකල්පය හා අප යන සංකල්පය අතර බද්ධ වීමක් සිදුවීමත්, ඒ බද්ධ වීම නැවත වෙන් කළ නොහැකි වීමත් යන අදහස් මෙයින් කියවේ.

ඒ බද්ධ වීම බොහෝ දුරට සිදුවන්නේ තමන් සංවිධානය වූ සමාජයක කොටස්කරුවන්ය යන අදහස වර්ධනය වීමත් සමඟ ය. සමාජයක් සේ සංවිධානය වීම සුලුපටු කාර්යයක් නොවේ. එසේ සංවිධාන ගතවීම හුදෙක් ම අදහසක් ද නොවේ. එය ප්‍රායෝගික බැඳීම් මාලාවක් ඇති වීම තුළින් සිදු වේ. මෙසේ ප්‍රායෝගික සංවිධාන රටාවක් ගොඩනැඟීම සිදුවන්නේ තමන්ගේ ම අනන්‍යතාව පිළිබඳ ව මෙන් ම තමන් බද්ධ වන සංවිධාන රටාව විසින් අත්පත් කර ගන්නට යන්නේ කුමන අරමුණ ද ආදිය ගැන ඇති වන අවබෝධයක් තුළිනි. මේ සිදුවීමත් සමඟ ම මා හා අප යන සංකල්පවල බද්ධ වීම බොහෝ දුරට සිදුවන්නේ කිසියම් යුතුකම් මාලාවක් පිළිබඳ ව ඇති වන පොදු හැඟීම් පද්ධතියක් හා අවබෝධයක් මඟිනි. ඒ යුතුකම් මාලාව පිළිබඳ වඩා තීව්‍ර පොදු අවබෝධයක් ඇතිවනවාත් සමඟ ම ජනනය වන තවත් සංකල්පයක් වන්නේ අයිතිවාසිකම් පිළිබඳ අවබෝධය ය. යුතුකම් මඟින් අයිතිවාසිකම් නිර්මාණය කරයි. අයිතිවාසිකම් මඟින් යුතුකම් තහවුරු කරනු ලබයි. මේ ආකාරයෙන් තමන් අතර ඇති කර ගන්නා වූ සංවිධාන රටාව යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ ක්‍රමයෙන් සිදු වන වර්ධනය නිසා වඩවඩාත් තහවුරු වෙයි.

දැයක් යනු දෙයක් නොවේ යයි ඉහතින් කරන ලද සඳහන් කිරීම ඉන් පසු ව සාකච්ඡා කරන ලද යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ සංවාදය තුළින් අවබෝධ කොට ගත යුතු වෙයි.

ඒ සංවිධානගත වන සමාජය ක්‍රමයෙන් මේ යුතුකම් හා අයිතිවාසිකම් ඉතා සංකීර්ණ ආකාරවලින් වර්ධනය කර ගන්නා අතර, ඒ වර්ධනයේ එක් අවස්ථාවක දී නීතිය යන අදහස ඒ සමාජය තුළ මල්පල ගනී. මේ අවධිය කිසියම් සංවිධාන රටාවක ඉතාමත් ම වැඩි දියුණු අවධියක් වෙයි. දැන් මා හා අප යන සංකල්පවල බද්ධ වීම සිදුවන්නේ සාධාරණ යැයි සියල්ලන් විසින් ම පිළිගන්නා ලබනු ලබන නීති මාලාවක්

තුළිනි. සාධාරණය පිළිබඳ අදහස හා නීතිය යනු එකක් ම නොවේ. බොහෝ විට අසාධාරණ නීති ඇතිවීමට පුළුවන. ඒවා නිෂ්ප්‍රභා කර ගත හැක්කේ සාධාරණත්වය පිළිබඳ අවබෝධය කොපමණක් ගැඹුරින් ඒ සමාජය තුළ පවතිනවා ද යන ප්‍රමාණයට ය.

සාධාරණත්වය පිළිබඳ අදහස, සංවිධාන රටාවක් මඟින් ඒකාබද්ධ වන මිනිසුන් අතර වර්ධනය වීම සිදුවන්නේ ඔවුන් තුළ තමන් අගය කරන වටිනාකම් මොනවා ද යන්න පිළිබඳ ව ඇතිවන්නා වූ අවබෝධය හා එකඟතාව මඟිනි. වටිනාකම් පිළිබඳ ඇති කර ගන්නා වූ අවබෝධය තුළ ම තමන් විසින් පොදුවේ බැහැර කිරීමට එකඟ වන වැරදි පිළිබඳ අවබෝධය ද වර්ධනය වෙයි. එක අතකින් වටිනාකම් පිළිබඳ අවබෝධයත් අනෙක් අතින් වැරදි පිළිබඳ අවබෝධයත් ගැඹුරු මට්ටමකින් වර්ධනය වීම තුළින් මා හා අප පිළිබඳ ව තිබූ අදහස් වඩා වැඩිදියුණු අදහස් බවට පත් වන අතර, ඒ අදහස් ඒ සමාජ සංවිධානයේ අත්තිවාරම බවට පත්වේ. එවැනි අත්තිවාරමක් ගොඩනැගුණු පසු එය ශක්තිමත් සමාජයක් බවට පත් වෙයි. මේ අදහස් ද නීතිය යන සංකල්පය මඟින් වඩ වඩාත් නියෝජනය වෙයි. එමෙන් ම නීතිය පිළිබඳ අදහස ද ඒ සමාජය තුළ වර්ධනය වී ඇති සාධාරණත්වය පිළිබඳ අවබෝධය තුළින් ඔපමට්ටම් කරනු ලැබේ.

මෙසේ ඔපමට්ටම් වන සමාජය තුළ කිසියම් රීතීන් මාලාවක් වර්ධනය වන අතර, එය සමාජයේ සිටින සියලු දෙනාගේ ම අනුමැතියට යටත් වෙයි. ඒ රීති මාලාව ද නීතියේ විවිධ අංග මඟින් ප්‍රකාශයට පත් වෙයි. සමහර රීතීන් අතිශයින් වැදගත් කොට සලකන්නට පටන් ගත් පසු ඒ සමාජය තුළ ව්‍යවස්ථාවක් පිළිබඳ අදහස වර්ධනය වෙයි. ව්‍යවස්ථාවක් යනු සමාජයේ ජීවත් වන සියලු දෙනා ම පොදුවේ වැලඳගත් අදහස් අතර ඉතාමත් ම උතුම් හා කිසිවෙක් විසින් නොතකා හැරීමට ඉඩක් නැති රීතීන් මාලාවක් බවට පත් වෙයි.

එසේ වර්ධනය වන සමාජය තුළ ඇති වන තවත් විශේෂ අංගයක් වන්නේ අපරාධය පිළිබඳ සංකල්පයයි. සංවිධාන රටාවක් තුළින් ඒකාබද්ධ භාවයකට පත් වන ජනකොටස් තුළ ම ඒ සංවිධාන රටාවට බාධා ඇති කරන සමහර ගතිගුණ හා පැවතුම් ඇති වීම වැළැක්විය නොහැකි ය. මිනිස් සංහතියේ

ඇති දුර්වල කම් එවැනි හැසිරීම් තුළින් ප්‍රකාශයට පත් වෙයි. අංග සම්පූර්ණ මනුෂ්‍යත්වය යයි කියා දෙයක් නැත. ඒ නිසා තම සමාජය තුළ වැරදි ඇති විය හැකි බවත්, ඒවායින් සමහර වැරදි මුළුමනින් ම බැහැර කර ගැනීමේ ක්‍රමවේදයක් පැවතිය යුතු බවත්, යන අවබෝධයට ජන සමාජයක් අවතීර්ණ වූ පසු ඔවුන් අතර අපරාධ යනුවෙන් නම් කරන යම් ගතිපැවතුම් පිළිබඳ සටහන් කර ගැනීමක් ඇති වෙයි. ඒවා බැහැර කර ගැනීමේ ක්‍රමවේදයන් ද සමාජ සංවිධානය විසින් ම නිර්මාණය කරනු ලබයි.

ඉහත සඳහන් ගුණාංගයන්ගෙන් බොහෝ දුරට පරිපූරණය වූ සමාජය දැයක් යනුවෙන් තමන් හඳුන්වා ගනු ලබයි. දැයක් යන්න නව අවබෝධයක හා නව සහෝදරත්වයක ප්‍රකාශනය වේ. එකිනෙකා පිළිබඳ ගරු කිරීමක් හා විශ්වාසයක් ඇතිවන්නේ දැයක් පිළිබඳ වර්ධනය මේ ආකාරයෙන් සිදු වී ඇති සමාජයන් තුළ පමණ ය.

එසේ දැයක් යනුවෙන් තමන් ඇති කර ගත් සංවිධානයේ අගය හා බලවත් කම සියල්ලන් විසින් ම අවබෝධ කර ගන්නා තත්ත්වයක දී ඒ සංවිධානයට විරුද්ධ ව ඇති වන බලවේග නැති කර දැමීම සඳහා තම ජීවිත පූජාවෙන් පවා මිනිසුන් කැප වෙති. ඒ කැප කිරීම බාහිර බලකිරීමක් තුළින් ඇතිවන්නක් නොවේ.

* * * *

# සංවිධාන රටාව

මා හැදී වැඩී ජීවත් වූ සමාජය තුළ දැයක් පිළිබඳ ව බොහෝ දුරට වර්ධනය වූ පිළිගැනීමක් පැවතියේ ය. එය අංග සම්පූර්ණ වූ එකක් නොවන බව මම පිළිගනිමි.

එසේ අංග සම්පූර්ණ එකක් නොවූයේ එහි මූලාරම්භය පිටින් පැටවූ එකක් වූ නිසා ය. වර්තමාන ලෝකයට අපි ඇතුළු වීමට පටන් ගත්තේ යටත් විජිතයක් ලෙසිනි. ඉන්පසු ඇති කරන ලද සංවිධාන රටාව තුළ යුරෝපීය රටවල දැයක් පිළිබඳ ව වර්ධනය වී තිබූ වැඩි දියුණුම අදහස් ගැබ්ව තිබුණේ ය. එය දීර්ඝ කාලයක් තුළ ලාංකීය සමාජයට ද ඇතුළු වී ඒ තුළ ස්වභාවික තත්ත්වයකට පත් විය.

පිටින් පැටවූ සමහර සංවිධාන විලාසයන් කාලයක් වෙනත් සමාජ වාතාවරණයක බලවත් ව පැවතීම නිසා ම ඒ බාහිරයෙන් පැටවූ සංවිධාන අංගෝපාංගයන් සමාජගතවීමක් සිදු වේ. එවැන්නක් ලංකාවේ ද සිදු විය.

එහෙත් මා මුලින් කී සේ ඒ සංවිධාන රටාව අංග සම්පූර්ණ එකක් නොවූයේ රට අභ්‍යන්තරය තුළ ම යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ ව ඇති වී වර්ධනය වූ ගැටුම් මාලාවන් තුළින් එය නිර්මාණය නොවූ නිසා ය.

එසේ වුව ද මූලික වශයෙන් සමාජය එක් කොට පවත්වා ගෙන යා හැකි වූ සංවිධාන රටාවක මුල්බැස ගැනීමක් අප රට තුළ සිදු වී තිබුණි. ඒ කාලය තුළ හැදී වැඩුණු අප, අපගේ අභිමතාර්ථයන්, අභිලාෂයන් හා පරමාර්ථ ගොඩනගා ගත්තේ ඒ සමාජ රටාවේ පසුබිම ඔස්සේ ය. ඒ රටාව තුළ තිබූ මා හා අප

යන අදහස්වල ඒකාබද්ධ කිරීම අපගේ බුද්ධිමය හා මානසික ගතිපැවතුම් නිර්ණය කළ වාතාවරණයක් ජනනය කළේ ය.

ඒ වාතාවරණයේ හැදී වැඩුණු නීතිඥයාත්, විනිශ්චකාරවරයාත් තමන්ගේ සියලු ම කටයුතුවල කේන්ද්‍රය බවට පත් කර ගත්තේ රට වැසියා ආරක්ෂා කිරීමේ යුතුකම තමන්ගේ වෘත්තීන්ගේ ප්‍රධානම වගකීම වශයෙන් සලකා ගෙන ය.

ඒ වගකීම තුළින් එදා අප ජීවත් වූ සමාජයේ එක්තරා සුවිශේෂ වූ අංගයක් ප්‍රකාශයට පත් කරයි. එනම් අධිකරණය ජනතාවගේ අයිතිවාසිකම්වල මුරදේවතාවා නොහොත් මූලික ආරක්ෂකයා වශයෙන් පැවති බව ය. ඔබ මෙය කියවන කාලය වන විට මේ අදහස තේරුම් ගැනීමට ඔබට කෙසේවත් හැකි නොවනු ඇතැයි යන්න මගේ විශ්වාසය ය. එය පුදුම වීමට ද දෙයක් නොවේ. ආරක්ෂකයෙකු පිළිබඳ අදහස ඇතිවන්නේ සැබෑ ආරක්ෂකයෙකු දැකීමේ හා ඒ ආරක්ෂකයා ක්‍රියා කරන ආකාරය අවබෝධ කර ගැනීමට පවතින ඉඩකඩ අනුව ය. එවැනි ආරක්ෂකයෙකු දැක ගත නොහැකි නම් සැබවින් ම ඒ අදහස ම පවා බොහෝ දුරට අර්ථ ශූන්‍ය දෙයක් බවට පත් වේ. ඔබට ජීවත් වීමට සිදුවන්නේ එවැනි වාතාවරණයක බව මට තර්කානුකූල ව සිතා ගත හැකි ය. ආරක්ෂකයා පිළිබඳ අදහස ඔබ ද අසා තිබෙන්නට පුළුවන් වුවත්, ඔබට එය අත්දැකීමට නුපුළුවන.

ඕනෑ ම වර්ගයක ආරක්ෂකයෙකු තුළ තිබිය යුතු ගුණය වන්නේ ඔහු තමාගේ කාර්යය කිරීමට තරම් බලය ඇත්තෙකු වශයෙන් සිටීම ය. බලවත් නොවූ ආරක්ෂකයාට කිසිවක් ආරක්ෂා කිරීමට නුපුළුවන. ආරක්ෂකයාගේ බලය ඔහු සතු විය යුතුවා පමණක් නොව ඔහුට ඒ බලය තිබෙන බව ද බාහිර වශයෙන් ද ප්‍රදර්ශනය විය යුතු ය. කෙසඟ මිනිසෙකුට අලියෙක් එසවීමේ ශක්තිය ඇතැයි කිසිවෙකුත් විශ්වාස නොකරනු ඇත. යුතුකම ඉටු කිරීමට තරම් සවිබලයක් තමන් සතු බව ප්‍රදර්ශනය කිරීමට ආරක්ෂකයාට හැකි විය යුතු ය.

මා ජීවත් වුණු හැදුණු සමාජය තුළ අධිකරණය පිළිබඳ අදහස වූයේ එවැනි සවිබල ඇති, යෝධ ගුණයක් ඇති සංස්ථාවක් ලෙසිනි. මීට ඉහත දී බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයාගේ අණ නිෂ්ප්‍රභා

කිරීමට ඉදිරිපත් වූ විනිශ්චකාර මණ්ඩලයක් ගැන සඳහන් කරන ලදි. එහි දී විනිශ්චකාරවරයාගේ ආරක්ෂාව පතා ගිය ඇත්තන් ඒ ආරක්ෂාව ලබා දීමේ හැකියාව අධිකරණය සතු බව වටහා ගෙන සිටියහ. එවැනි වැටහීමක් නොතිබුණා නම් ඔවුන් ඒ අධිකරණය ඉදිරියට නොයන්නට ඉඩ තිබුණි.

මෙහි දී බලවතුන් දෙදෙනෙකු අප ඉදිරියේ මැවී පෙනේ. ඉන් එක බලවතෙකු වනාහි අධිකරණයයි. අනෙක් බලවතා නීතිඥයායි. තමන්ගේ තර්ක බුද්ධිය තුළින් හා නීතිය පිළිබඳ ව අවබෝධය තුළින් යම් කටයුත්තක් කරවා ගැනීමට අධිකරණයට බලකර සිටිය හැකි බව නීතිඥයා දැන සිටී. ඔහුගේ ආත්ම විශ්වාසය ගොඩනැගී ඇත්තේ ඒ අදහස මත ය. එවැනි ආත්ම විශ්වාසයක් ඇති නීතිඥයා යම් අයෙකු ආරක්ෂා කිරීමේ කර්තව්‍යයට බියෙන් තොර ව ඉදිරිපත් වේ. තමන් කරන්නට හැකි යයි කියා සිටින්නේ ඇත්තෙන් ම කළ හැකි දෙයක් බව ඔහු දැන සිටී. ඒ නිසා එසේ කළ හැකි බවට පොරොන්දුවක් තම සේවා යෝජකයාට දීමට තරම් ඔහු එඩිතර වෙයි. ඒ එඩිතර බවේ පදනම පුහු ආඩම්බරය නොව තමන් ජීවත් වන සමාජයේ සංවිධාන රටාව පිළිබඳ ව නීතිඥයා සතු අවබෝධය වේ. ඒ අවබෝධයේ ප්‍රභාවයෙන් උද්ධාමය ලබන ඔහු මොනම හෝ බලවතෙකුටවත් බිය නොවී තම සේවායෝජකයා ආරක්ෂා කර දීමට ඉදිරිපත් වෙයි.

අධිකරණය ඉදිරියේ දී තමා නිවටයෙකු හෝ කවටයෙකු ලෙස සැලකිල්ලට භාජනය නොවන බව ඔහු හොඳින් දැන සිටී. අධිකරණයේ විනිශ්චකාරවරයා නීතිඥයාගෙන් බලාපොරොත්තු වන්නේ ඔහු ඉදිරිපත් වන කාර්යය අව්‍යාජ ව හා කාර්යක්ෂම ව ඉටු කරන ලෙස ය.

විනිශ්චකාරවරයා නීතිඥයාට සවන් දීමේ උවමනාවෙන් පෙනී සිටී. එසේ ඇහුම්කම් දීම තුළින් තමන්ගේ යුතුකම කිරීමට නීතිඥයාගේ සහයෝගය ලබා ගැනීමට විනිශ්චකාරවරයා උනන්දු වෙයි.

ආරක්ෂාව වනාහි භාරධූර කටයුත්තකි. ආරක්ෂාව නැති කම නිසා කෙනෙකුගේ ජීවිතය ද ඔහුට අහිමි විය හැකි ය. එසේත් නැත්නම් ඔහුගේ නිදහස හෝ ඔහුගේ දේපළ ඔහුට අහිමි වී

යැමට ඇති ඉඩකඩක් ඇත. මේ නිසා ආරක්ෂා කිරීමේ වගකීම භාරගන්නා තැනැත්තා සුවිශාල වගකීමක් භාර ගනී.

එවැනි වගකීමක් භාරගත හැක්කේ ඒ වගකීම ඉටු කිරීමට හැකි පසුබිමක්, වාතාවරණයක් තිබෙනතාක් දුර පමණි. අප ජීවත් වූ වඩා සාරවත් වූ කාලය තුළ එවැනි වාතාවරණයක් පැවතියේ ය. රටවැසියා ආරක්ෂා කිරීමේ උවමනාවෙන් සිටි අධිකරණයක් පැවතියේ ය. අධිකරණයට ඒ යුතුකම් ඉටු කළ හැකි ආකාරයට රටේ සංවිධාන රටාව ගොඩනැගී තිබුණේ ය. එවැනි වාතාවරණයක් පවතින බව දන්නා නීතිඥයා තමන්ගේ සේවය පතා එන සේවා යෝජකයා සාදරයෙන් පිළිගන්නේ තමන්ගේ යුතුකම මෙන් ම හැකියාව හා දක්ෂතාවන් ද විදහා පෑමට අවස්ථාවක් මේ සේවායෝජකයාගේ පැමිණීම නිසා ඇති වන බව පිළිබඳ විශ්වාසය මත ය.

එසේ පැවති විශ්වාසය දියවී යන ආකාරය මාගේ ජීවිතයේ අවසාන කාලය තුළ දකින්නට වීම නිසා මා තුළ මෙන් ම මා වැනි වෙනත් අය තුළ ඇති වී තිබෙන කම්පනයේ ප්‍රමාණය ඔබට තේරුම් ගැනීමට අමාරු වනු ඇත. යම් හැකියාවක් පිළිබඳ බලාපොරොත්තුවක් මත මුළු ජීවිත රටාවම ගොඩනගා ගත් මිනිසුන් ඒ හැකියාව තමන් අතින් පහවී යනු දකින්නේ කොතරම් සංවේගයකින් ද?

ඒ සංවේගය තමන් සතු බලයක් නැති වී යෑම පිළිබඳ ව ම නොවේ. තමන්ගේ ආරක්ෂාව සලසා දීමට තරම් සංවිධාන රටාවක් රට තුළ නැති බව පිළිබඳ ව අවබෝධය ජනතාවක් අතර පැතිරී යෑම කොපමණ තරමක ඛේදවාචකයක් ද? ඇත්තෙන් ම එය ඇති විය හැකි සියලු ම ඛේදවාචකයන් අතර මුල් තැන ගනී.

ආරක්ෂාවෙන් තොර සමාජය බියකරු තැනකි. ඒ බියකරු තැනේ මූලාරම්භය දුටුවන් අතර මම ද එක් අයෙක්මි. ඔබ උරුම කර ගන්නා සමාජයත්, එය තුළ පවතින ආරක්ෂා විරහිත භාවයත් මට මේ ඈතක සිට වුව ද දැනෙන්නට පටන් ගෙන ඇත.

* * * *

# ආරක්ෂකයෝ

සමාජය වශයෙන් සංවිධානය වූ ජනතාවකගේ ආරක්ෂාවට දෙයාකාරයක තර්ජන එල්ලවිය හැකි ය. එක් ආකාරයක් නම් බාහිර වශයෙන් එල්ලවන තර්ජන ය. වෙනත් රටක් විසින් ආක්‍රමණයකට හෝ පහර දීමකට ලක්වන්නේ නම් එය බාහිර බලවේග මඟින් කිරීමට උත්සාහ කරන තර්ජනයකි. එවැනි අවස්ථාවක, තමන්ගේ ආරක්ෂාව සඳහා යුද්ධ කිරීමට සිදුවීමට පුළුවන. එවැනි අවස්ථාවක බාහිර අනතුරෙන් ආරක්ෂා වීමේ තත්ත්වය බොහෝ දුරට රැඳෙන්නේ තමන් සතු ආයුධවල හා හමුදාවන්ගේ ශක්තිය මත ය. මෙහි දී වුවත් දැයක් වශයෙන් ගැඹුරු බැඳීමක් ඇති ව සංවිධානය වී ඇති මිනිස් සමාජයක බලය බිඳීමට හුදෙක් ම ආයුධ මට්ටමින් වැඩි බලයක් තිබීම නිසා ම නොහැකි බව ඉතිහාසයේ බොහෝ සිදුවීම් තුළින් විදහා පා ඇත. වර්තමාන ලෝකයේ බලවත් ම රාජ්‍යය වන ඇමරිකාවට වත්කම් අතින් දුගී තත්ත්වයක පසුවන වියට්නාමය පරාජය කිරීමට බැරි විය. වියට්නාම් ජාතිකයන්ගේ අභ්‍යන්තර සංවිධාන රටාව බිඳ දැමීමට දීර්ඝ කාලයක් පුරා කළ යුද්ධයක් මඟින් පවා බැරි විය. දකුණු ආසියාව තුළමත් මෙවැනි අත්දැකීම් ඇත. මහා බලපරාක්‍රමයෙන් යුතු ව සිටි අශෝකා අධිරාජ්‍යයා කාලිංග රට සමඟ කළ යුද්ධය මේ පිළිබඳ ව මහඟු උදාහරණයකි. කාලිංග රට ආයුධ අතින් හා ජනගහනයේ ප්‍රමාණය අනුව අඩු බලයක් තිබූ රටක් විය. එහෙත් රටවැසියාගේ අභ්‍යන්තර බැඳීම් තුළින් බලන කල එය මහඟු ශක්තියක් පෙන්නුම් කළ රටක් විය. යටත් විජිතයක් බවට පත්වීමට වඩා තමන්ගේ දැය වෙනුවෙන් මිය යෑමට ඒ රටේ මිනිසුන් හා ගැහැනුන් නිර්භීත ව ඉදිරිපත් විය. මේ ගැඹුරු එකමුතුව අශෝකා අධිරාජ්‍යයා තුළ ඔහු එතෙක් විශ්වාස

කර ගෙන තිබූ යුද්ධ ශිල්පයන්ගේ ශක්තිය සම්බන්ධයෙන් විශාල සැකයක් හා කම්පනයක් ඇති කළේ ය.

යුද්ධ පිළිබඳ ප්‍රශ්නය ඇතිවන්නේ බොහෝ කලාතුරකිනි. දැයක ආරක්ෂාවට ඇති විය හැකි විශාල ම බාධකය නම් ඒ දැයේ ජීවත් වන මිනිසුන් තුළ එකිනෙකා කෙරෙහි ඇති බැඳීමේ ශක්තිය හීන වීම ය. එසේ වුවොත් එය සියලු ම දෙනාගෙත්, ඔවුන් සාදා ගත් සමාජ රටාවේත් විනාශයට හේතු විය හැකි ය.

එවැනි අභ්‍යන්තර ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් ඇති වූ කල එය නිරාකරණය කර ගැනීමේ හැකියාව ඇත්තේ ආයුධ පිළිබඳ ශක්තිය හා හමුදාවේ ශක්තිය මත නොවේ.

බිඳී ගිය අභ්‍යන්තර එකමුතුව නැවත සැබවින් ම ඇති තත්ත්වයක් උදා කර නොගෙන, දැයක අභ්‍යන්තර ශක්තිය නැවත නිර්මාණය කර ගත නොහැකි ය.

මෙහි දී එකමුතුව යනුවෙන් කුමක් අදහස් කෙරේදැයි සලකා බැලිය යුතු ය. එකතුව යන්න බාහිර දෙයක් නොවේ. එය යම් මූලධර්මයන් ප්‍රතිපත්තීන් හා චර්යා ධර්මයන් පිළිබඳ ව ඒ සමාජයේ ජීවත්වන්නන් අතර ඇති එකඟතාව වශයෙන් හැඳින්විය හැකි ය. මූලධර්ම පිළිබඳ එකඟතාව යන්න අතීතයේ අශෝකා අධිරාජ්‍යයාගේ යුගයේ දී ධම්ම යනුවෙන් සඳහන් කළ අදහසට සමාන එකක් වෙයි. තමන්ගේ සමාජය කුමන ආකාරයක සමාජ සම්බන්ධතාවන්ගෙන් සමන්විත යුතු ද යන්න පිළිබඳ ව ඇති කර ගන්නා මූලික අදහස් හා ප්‍රතිපත්ති සමාජ මූලධර්ම වශයෙන් හැඳින්විය හැකි ය. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මේ මූලධර්ම වන්නේ නිදහස, සමානාත්මතාව හා සහෝදරත්වය යන අදහස් ය. මේ අදහස් හුදෙක් ම රසවත් වචන මාලාවක් පමණක් නොවෙයි. මේ සෑම වචනයක් පිටුපසම විශාල දර්ශනවාදයක් ඇත. එමෙන් ම ඒ අදහස් පිළිබඳ එකඟතාවකට පැමිණියේ ඊට විරුද්ධ ව පැවති අදහස් ද ඒ අදහස් මත ගොඩනැගුණු සමාජ රටාව ද බිඳ දැමීම තුළිනි. එය නිදහස වැඩි ජනතාවකට අයිතියක් නැති දෙයක් ලෙස ඉතිහාසය පුරා බොහෝ කාලයක් තුළ සලකනු ලැබී ය. සමාජයේ වැඩි දෙනෙකුගේ ජීවිතය ඒ සමාජයේ වැඩි වරප්‍රසාද ලැබූ ටික දෙනෙකු වෙනුවෙන් වැය විය යුතුය යන

අදහස මුල් බැස තිබූ අතර, ඒ සුළු කණ්ඩායමේ සේවය සඳහා වැඩි කණ්ඩායම තම නිදහස අතහැර දැමිය යුතු විය. බොහෝ රටවල පැවති වහල්භාවය තුළත්, දකුණු ආසියාවේ ව්‍යාප්තව පැවති කුල ක්‍රමය තුළත් පැවතියේ මේ නිදහස සීමා කිරීම ය. එවැනි අදහස් හා ඒ මත පදනම් වූ සමාජ ක්‍රමයන් පරදවා දමා නිදහස යන සංකල්පය හිස ඔසවා ගත්තේ ය. හුස්ම ගැනීමට ඇති අයිතිය මෙන් ම නිදහස ද සැම දෙනාට ම පොදුව ඇති සම්පතකි. සමානාත්මතාව පිළිබඳ අදහස අතිශයින් වෙහෙස දරා බොහෝ පරිත්‍යාගයන් කොට අත්පත් කර ගන්නා ලද අදහසකි. කුමන හේතුවක් නිසාවත් කිසිදු අයෙක් තවත් අයෙකුට අඩු හෝ වැඩි වැදගත්කමකින් නොසැලකීම මේ අදහසේ පදනම ය. මෙයින් අදහස් කරන්නේ විවිධ වෙනස්කම් නැතිකම නොවේ. අවසාන වශයෙන් ගත් කළ සමාජ වටිනාකම් තක්සේරු කිරීමේ දී සියල්ලන්ට ම ඇත්තේ එකම වැදගත්කමක් හෝ බරක්ය යන අදහස මෙයින් කියවේ. මෙය දැයක බද්ධ වීම තහවුරු කිරීමේ දී අත්‍යවශ්‍ය වන්නා වූ බන්ධන පථයකි. සමානාත්මතාව පිළිබඳ ගැඹුරු පිළිගැනීමකින් තොර ව දැයකට, දැයක් වශයෙන් පැවතිය නොහැකි ය. භේද බින්න වූ ජනකණ්ඩායම් වශයෙන් පැවතීම, දැයක් ලෙස පැවතීමට හාත්පසින්ම වෙනස් වූ තත්ත්වයකි. සහෝදරත්වය යන්න මඟින් අදහස් වන්නේ එකිනෙකා පිළිබඳ ආදරයක්, කැපවීමක්, කරුණාවක් යම් සමාජයක් තුළ පැවතීම ය. එකිනෙකාට අකාරුණික වන සමාජයකට දැයක් බවට පත් විය නොහැකි ය.

මා ජීවත් වූ මුල් කාලය තුළ මේ මූලධර්මයන් පිළිබඳ ව මූලික එකඟතාවක් පැවතුණා පමණක් නොව ඒ එකඟතාව වඩාත් ගැඹුරු එකක් බවට පත් කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ කල්පනා රටාවක් ද පැවතියේ ය. එහෙත් මාගේ ජීවිතයේ අවසාන කාලය තුළ මා දකින්නේ මේ සියලු ම මූලධර්මයන් කෙරෙහි නොසැලකිල්ලක් පමණක් නොව කිසියම් විරුද්ධත්වයක් ද වර්ධනය කරනු ලැබූ බව ය. එසේ කිරීම එතරම් අමාරු දෙයක් නොවේ. සමාජය පදනම් වන මූලික අදහස් සැහැල්ලුවට ලක් කළහොත් හෝ විහිළුවට ලක් කළහොත් කෙටි කාලයක් තුළ දී දැයක පදනම බිඳ දැමිය හැකි ය. මාගේ ජීවිතයේ අවසාන

කාලය තුළ මා දකින්නේ එවැනි සැහැල්ලු කිරීමක්, බාල්දු කිරීමක් හා පැහැර හැරීමක් අපගේ රට තුළ ව්‍යාප්ත වූ ආකාරයයි.

මා ඔබට මුලින් කී මේ 82 වසරේ දී පැවැත්වූ ජනමත විචාරණය ගැන සලකා බලන්න. හය අවුරුද්දකට තවදුරටත් මන්ත්‍රී වරයන්ගේ ඡන්ද කාලය දිග්ගස්සා ගැනීම තුළින් අප සමාජය පදනම් ව තිබූ සියලු මූලධර්මයන් හා දේශපාලන සාරධර්මයන් ද එකපෑන් පහරකින් තුරන් කර දමන ලදි. මෙසේ කිරීමක් ගැන අදහසක්වත් යම් කෙනෙකු තුළ පහළ වූවා නම් එය සැලකිය යුතු ව තිබුණේ විකාරයක් හෝ පිස්සුවක් ලෙසිනි. එහෙත් පිස්සන්ට පමණක් කළ හැකි දෙයක්, අප රට තුළ - එහි ප්‍රධාන ම සංස්ථාව පිළිබඳ ව යොදා ගැනීමට - ඉඩ හරින තත්ත්වයකට පත් විය. සාමාන්‍ය සිහිබුද්ධිය ඇති කණ්ඩායමක් වශයෙන් සිටි අප ව හදිසියේ පිස්සන් රැලක් බවට පත් කර දමන ලදි.

එහෙත් එය කරන ලද එකම වැරැද්ද නොවේ. අපට ම ආවේණික වූ ආකාරයකට අපේ ව්‍යවස්ථාව සාදාගන්නවාය යන කථාව ඔස්සේ පාලනයක පැවැත්මට අවශ්‍ය අත්‍යවශ්‍ය මූලධර්ම අපගේ ව්‍යවස්ථාව හා නීතිය තුළින් ඉවත්කර ගන්නවා බලා සිටීමට අපට සිදු විය. බලය බෙදීම පිළිබඳ ඉතා ම මූලික වන දේශපාලන සංකල්පය අතහැර දමා අධිකරණය, විධායකයට හා ව්‍යවස්ථාදායකයට යටපත් කර දැමීම බලා සිටීමට අපට සිදු විය.

අධිකරණයක් දුර්වල තත්ත්වයකට පත් කර දැමීම වනාහි දැයක් තුළ සංවිධානය වී ජීවත් වන මිනිසුන්ගේ ප්‍රධාන ආරක්ෂකයා දුර්වල කර දැමීමක් වේ. ආරක්ෂකයා දුර්වල වූ විට ඕනෑ ම හතුරෙකුට ඔවුන්ට කැමති ලෙස ජන ජීවිතය බිඳ දැමීමට මාවත උදා විය. ලෙඩකට මුහුණ දීමට ඇති ප්‍රතිශක්තීන් යමෙකුගේ සිරුර තුළින් නැති වී හෝ දුර්වල වී ගියහොත් ඔහු හෝ ඇය පත් වන තත්ත්වයට ලාංකික සමාජය ද පත්වෙනවා බලා සිටීමට අපට සිදු විය.

විකට නළුවෙකු තමන්ගේ නහය, කන හා වෙනත් අවයව නාට්‍යාකාරයෙන් ගලවා විසිකර දමන ආකාරයට, දැයක් වශයෙන් ලාංකික ජනතාව බැඳ තිබූ සියලු ම බැඳීම් ගලවා විසිකර දමන ආකාරය බලා සිටීමට අපට සිදු විය.

මා ලියන මේ මොහොත වන විට මේ ව්‍යසනය සෑහෙන දුරක් පැතිරී අවසාන ය. ගිනිකන්දක් ඇති වූ පසු එය වහා නිවා දැමිය නොහැකි සේ දැන් අප මේ මුහුණ දෙන තත්ත්වය තව කාලයක් පුරා ම පැතිර පවතිනු ඇත.

මේ කියවන ඔබගේ ජීවිත කාලය පටන් ගන්නේ එවැනි ව්‍යසනයක ප්‍රතිඵල උරුම කර ගත් අයගේ පැවැත්මක් වශයෙනි. ඔබට සිදු වූ, සිදු වී ඇති මේ දෙයෙහි මූලාරම්භය වශයෙන් මා මේ කරන සටහන, ඔබ පිළිබඳ ව ම අග මුල සොයන ඔබට යම් ආකාරයක මඟ පෙන්වීමක් වනවා ඇතැයි මම සිතමි.

* * * *

# උත්පත්තිය හා කැමැත්ත

තමන් වඩාත් ම අගය කරන දේ මොනවා ද යන්න හඳුනා ගැනීම කිසියම් පුද්ගලයෙකුට කිරීමට අමාරු කාර්යයකි. මෙය වඩාත් අමාරු කාර්යයක් වන්නේ බාහිර ලෝකය තුළ විශාල වෙනස්කම් පවතින කාලවල දී ය. ජන සමාජයකට, පොදුවේ තම සමාජයට වඩා වැදගත් වන ඇගයීම් මොනවා ද යන්න තෝරා බේරා ගැනීම වඩාත් අමාරු කාර්යයකි.

මා ජීවත් වූ කාලය තුළ මේ අමාරු කාර්යයට උර දී කිසියම් මූලික වටිනාකම් රාශියක් හඳුනා ගැනීමටත්, ඒ හඳුනා ගැනීම මත සමාජ සංවිධානය ගොඩනගා ගැනීමටත් උත්සාහයක් පැවතියේ ය. එසේ උත්සාහයක් පවතින කාලයක දී සමාජයේ දැන උගත්කමක් තිබූ වැඩි දෙනෙකු අතර තමන් ජීවත් වන සමාජය මොනවාගේ විය යුතු ද යන්න පිළිබඳ ව වටහා ගැනීමක් පැවතියේ ය. තමන් ක්‍රියාකාරී වූ ආයතන තුළින් මේ වටිනාකම් ක්‍රියාත්මක කරවීමට ද උනන්දු වූ වැඩි දෙනෙක් සිටියහ.

මෙය යම් උදාහරණ මගින් පැහැදිලි කළ හැකි ය. එකිනෙකාගේ තරාතිරම නොතකා සමාජයේ පොදු කටයුතුවල දී කාටත් මූලික වශයෙන් එක සේ සැලකිලිමත් විය හැකි සමාජ ක්‍රමයක් ඇති කර ගත යුතුය යන්න මා ජීවත් වූ කාලයේ දී අගය කළ අදහසක් විය.

මානව ඉතිහාසය පුරා ම උත්පත්තියෙන් ලැබෙන උරුමයන් මත වැඩි වරප්‍රසාද ලබා ගැනීමේ හැකියාව සැම සමාජයකම පැතිර පැවතියේ ය. මේ අදහස මූලික ව ම යුරෝපයේ දී ප්‍රශ්න කිරීමට භාජනය වූයේ 17 වන ශතවර්ෂයේ දී ය. මේ පිළිබඳ එක් සිද්ධියක් සකල මනුෂ්‍ය සංහතිය කෙරෙහි ම ඉතා ප්‍රබල

ව බලපෑවේ ය. ඒ සිද්ධිය නම් 1649 දී බ්‍රිතාන්‍යයේ රජුව සිටි පළමු වන චාල්ස් රජතුමා එකල ඇති වූ පාර්ලිමේන්තුව මඟින් නඩු විභාගයකට යටත් කොට එහි දුන් තීන්දුවක් අනුව රජතුමාගේ ගෙල සිඳ දමා ඔහුගේ මරණය සිදු කිරීම ය.

මේ ඝාතනය පිටුපස වූයේ උත්පත්තියෙන් හිමිකර ගන්නා වරප්‍රසාද අහිමි කළ යුතුය යන මතයක් සමාජගත වීම ය. රජු හා පාර්ලිමේන්තුව අතර ගැටුම උත්පත්තියෙන් උරුම කර ගත් වරප්‍රසාද මත රටක පාලනය හිමි කර ගැනීමට තිබූ අයිතිය අහෝසි කොට පාලනය සකල ජනතාවගේ කැමැත්ත මත පැවතිය යුතුය යන අදහස රටේ පිළිගත් බලවත් ම දේශපාලන එකඟතාවක් සේ ඉස්මතු විය.

ඊට පසු ශතවර්ෂයක් පමණ කාලයක් තුළ මේ අදහස සකල යුරෝපය තුළ ම ලැවු ගින්නක් සේ පැතිර ගියේ ය. මහජනයා දේශපාලනය කෙරෙහි යොමුවීම සම්බන්ධයෙන් සිදු වූ බලවත් ම වෙනස්කම මේ කාලය තුළ සිදු වුණා යයි කීම සාධාරණ ය.

උත්පත්තියේ උරුමය වෙනුවට දක්ෂතාව හා තමන් ජීවිත කාලය තුළ අත්පත් කර ගන්නා හැකියාවන්ට මුල් තැන ලැබිය යුතුය යන්න ලෝකය පුරා ම පසුකාලයේ දී පිළිගැනුණ දේශපාලන දර්ශනවාදය තීරණාත්මකව මුල්බැස ගත්තේ ඉහත සඳහන් සිද්ධීන් මාලාව ඔස්සේ ය.

කැමැත්ත මත ඇති වන පාලන ක්‍රමයක්, ඒ ක්‍රමය යටතේ ජීවත් වන කාගෙනුත් අසනු ලබන ප්‍රශ්නයක් වෙයි. ඒ ප්‍රශ්නය නම් ඔබ මට කැමති ද? යන්න ය. දේශපාලන ක්‍රමය මේ ප්‍රශ්නය සැම රටවැසියෙකුගෙන් ම අසනු ලබයි. රටවැසිභාවයේ එක් මූලික කොන්දේසියක් වන්නේ මේ ප්‍රශ්නයට සාධාරණ පිළිතුරක් දීමේ හැකියාව රටවැසියා තුළ පවතිනවා ද? නැද්ද? යන්න ය.

දැයක ශක්තිය රඳා පවතින්නේ තමන් පාලනය වන දේශපාලන හා සමාජ ක්‍රමය පිළිබඳ ව සිය කැමැත්ත හෝ අකමැත්ත ප්‍රකාශයට පත් කර ගැනීමට ඒ දැය තුළ ජීවත් වන ඇත්තන්ට හැකි ද? නැද්ද? යන්න මත ය. දැයක දේශපාලන හා සමාජ ක්‍රමය ප්‍රායෝගිකව සැම රටවැසියෙකුගේ ම ජීවිතය

කෙරෙහි බලපාන හෙයින්, මේ ප්‍රශ්නයට පිළිතුරු දීම එතරම් අමාරු කාර්යයක් නොවේ.

තරමකට අමාරු කාර්යය වන්නේ තමන් ජීවත් වන දැයෙහි ඇති දේශපාලන හා සමාජ ක්‍රමය කුමන මූලධර්ම යටතේ ගොඩනැඟී තිබේ ද? ඒ මූලධර්ම සාධාරණ හා සුබදායී ද? යන්න හඳුනා ගැනීමට රටවැසියාට ඇති හැකියාව ය. මේ හැකියාව ගොඩනඟන්නේ ද ඒ සමාජය තුළින් ම ය. යම් සමාජයක් අතිශයින් සංවාදශීලී නම් ඒ සමාජයේ ජීවත් වන ඇත්තන්ට විවේචනශීලී ව හා තර්කානුකූල ව මේ පාලන තන්ත්‍රය හෝ ක්‍රමය හොඳ ද? නරක ද? එය පිළිගත හැකි ද? නොහැකි ද? යන ප්‍රශ්නවලට සමාජයේ ඇති වන සංවාද තුළින් ම පිළිතුරු සොයා ගත හැකි ය.

මේ අනුව දැයක පාලන ක්‍රමයේ මූලධර්ම පිළිබඳ ව අඛණ්ඩ ව පැවතෙන සාකච්ඡාවක් අවශ්‍යයෙන් ම සිදු විය යුතු ය. ඒ සාකච්ඡාව මහජන කැමැත්ත ප්‍රකාශයට පත් කිරීමේ දී අත්‍යවශ්‍ය කොන්දේසියක් බවට පත් වේ.

මා ජීවත් වූ සමාජයේ මගේ ජීවිතයේ වැඩි කාලයක් තුළ එවැනි සංවාදශීලී භාවයක් පැවතියේ ය. රටේ වැඩි අධ්‍යාපනයක් ලබා තිබූ ඇත්තන්ගේ ප්‍රධාන ම යුතුකමක් ව පැවතියේ මේ සංවාදයට සහභාගී වීම ය.

රටේ නීතිය හා අධිකරණ ක්‍රමය ද හැදී තිබුණේ මේ සාකච්ඡාව අර්ථගැන්වීම සඳහා මහඟු සේවයක් කළ හැකි ආකාරයට ය. රට තුළ ඇති වන ගැඹුරු ම ප්‍රශ්න අවසානයේ දී අධිකරණයන් ඉදිරියේ දී ප්‍රකාශයට පත් වෙයි. අධිකරණයේ ශක්තිය පවතින්නේ එසේ ප්‍රකාශ වීමට ඇති සීමා විරහිත වාතාවරණය නිසා ය. නිදහස් ප්‍රකාශනය නීතියට හා අධිකරණයට ප්‍රාණ වායුව වේ. මේ වාතාවරණය නොපවතී නම් එයින් සමස්ත දැයෙහිම පැවැත්මට සුවිශාල තර්ජනයක් නිර්මාණය වෙයි.

මාගේ ජීවිත කාලය තුළ වැඩි කොටසක දී මෙවැනි තත්ත්වයක් බොහෝ දුරට පැවතුණා යැයි මට කිව හැකි ය. එය අංග සම්පූර්ණ ව පැවතුණා යැයි මම නොකියමි. එවැනි

අංග සම්පූර්ණ භාවයක් අත්පත් කර ගැනීමට තරම් දේශපාලන පරිණාමයක් අපේ දැය තුළ වර්ධනය වී නොතිබිණි. එහෙත් එවැන්නක් වර්ධනය වෙමින් පැවතියේ ය.

නීතිඥයා හා විනිශ්චකාරවරයා යන දෙදෙනාගේ ම කර්තව්‍යයන් පිටුපස වූයේ සමාජය පිළිබඳ ව මුළු දැය පුරා රැව්පිළිරැව් දුන් මූලික සංවාදයන් ය. නඩු තීන්දුවකින් විශේෂයෙන් ම නීතිය පිළිබඳ ව හා ව්‍යවස්ථාව පිළිබඳ ව ප්‍රශ්න වටා තිබූ නඩුවල දී, අධිකරණයෙන් බලාපොරොත්තු වූයේ සියලු ම පාර්ශ්වයන් කරනු ලබන සියලු ම වාදයන්ට සවන් දී ඉන්පසු සියලු ම කරුණු හා මූලධර්මයන් සලකා සමාජයට මඟපෙන්වීමක් විය හැකි ආකාරයට නඩු තීන්දු ප්‍රකාශයට පත් කිරීම ය. බොහෝ විට එවැනි නඩු පැවතුණේ එක් පුද්ගලයෙකු හා තවත් පුද්ගලයෙකු අතර හෝ යම් පුද්ගලයන් හා යම් ආයතන අතර විය හැකි ය. එහෙත් ඒ නඩුවල එන අවසාන තීරණ කාටත් පොදුවේ බලපාන කරුණු මත පදනම් වී ඇත.

මාගේ ජීවිතයේ අවසාන කාලයේ දී මා දකින්නට පටන් ගත්තේ මේ වාතාවරණය බිඳ දැමීම සඳහා බලවත් ප්‍රයත්නයක් ලාංකීය සමාජය තුළ පැතිරී යෑම ය. එය විවිධ කණ්ඩායම් තුළින් විවිධ ආකාරවලින් ප්‍රකාශයට පත් විය.

දැය පුරා පැතිර පැවතිය යුතු වන සංවාදශීලී භාවය ඉතා දැඩි ලෙස අභියෝගයට ලක්වෙමින් පැවතියේ ය.

අවසානයේ දී පාලන තන්ත්‍රයක් තුළ තිබිය යුතු බැරෑරුම් භාවය අහෝසි කරමින් මහජන බුද්ධිය පිළිකුලට හා අපහාසයට ලක්කරන ප්‍රමාණයේ සිදු වීම් ඇතිවීමට පටන් ගත්තේ ය. මා ඉහත සඳහන් කළ ආකාරයට, අවුරුදු 6 කට පත් වූ මන්ත්‍රී වරුන්ගේ වෘත්තීය ජීවිතය තව 6 අවුරුද්දකට වැඩිකර ගැනීම සඳහා පැවැත්වූ ජනමත විචාරණය එවැනි මහජන බුද්ධිය දැඩි පිළිකුලට හා හාස්‍යයට පත් කළ අවස්ථාවකි.

එවැනි තවත් බොහෝ දේ සිදු විය. ව්‍යවස්ථාව මඟින් ම අධිකරණයේ බලය ව්‍යවස්ථාදායකය තුළින් පැනනඟිනවා යැයි යන්න නීතියක් බවට පත් කිරීම එවැනි ම බරපතළ ලෙසින් මහජන

බුද්ධියට කරන ලද නින්දාවකි. ඒ තුළින් ප්‍රකාශයට පත් වූයේ, එය අගය කරන දැයක සමාජ අත්තිවාරම වන බලය බෙදීමේ සංකල්පයෙන් බැහැර වීම ය. ඒ බැහැර වීම ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ වාසියටත් අධිකරණයේ අවාසියටත් හේතුවන සේ රටේ මූලික නීතිය තුළට ම කාවැද්දීම ඉමහත් ඛේදජනක ක්‍රියාවක් විය.

අධිකරණයක ශක්තියට පහර දීම වනාහි දැයක ශක්තියට පහර දීමකි. සංවාදශීලී වාතාවරණය දැය තුළින් තුරන් කිරීමකි.

මා මේ ලිපිය ලියන්නේ එවැනි වෙනස්කම් දැක ඇති වූ දැඩි කම්පනයක හා කනස්සල්ලක ප්‍රතිඵලයක් වශයෙනි. මා වඩාත් කම්පනයට පත් කරන්නේ, මෙවැනි තත්ත්වයක් තවත් අවුරුදු ගණනාවක් තුළ උදාහරණයක් වශයෙන් අවුරුදු 25 ක් තුළ අඛණ්ඩ ව පැවතුණොත් එයින් අනාගත පරපුරට හිමිවන්නේ කුමන ආකාරයක දැයක් ද, කුමන ආකාරයක සංවාදශීලී බවක් ද, කුමන ආකාරයක කැමැත්ත ප්‍රකාශ කිරීමේ හැකියාවක් ද යන්න පිළිබඳ ව හිතන විට ය.

* * * *

# සොරකම් මැඩලීම

පාලනය පිළිබඳ ව එකිනෙකට හාත්පසින් වෙනස් ක්‍රමවේදයන් දෙකක් ගැන මා ඉහත දී සඳහන් කළෙමි. ඉන් එකක් නම් උත්පත්තිය පදනම් කර ගෙන බලයට උරුමය කියා පෑ රාජත්වය පිළිබඳ සංකල්ප යයි. අනෙක නම් රටවැසියාගේ කැමැත්ත මතින් පාලන ක්‍රමයත් පාලකයාත් යන දෙකම තෝරා ගැනීමේ පාලන ක්‍රමයයි. මෙසේ හාත්පසින්ම වෙනස් වූ අදහස් දෙකක් ලෝක ඉතිහාසයේ ප්‍රධාන ම දර්ශනවාදයන් හා මතවාදයන් නියෝජනය කරන අදහස් දෙකක් බවට පත්වීමට හේතුව කුමක් ද? එසේ වීමට හේතුව නම් පාලකයා තුළ හොරෙක් වීමට ඇති ප්‍රවණතාව හඳුනා ගැනීමට හැකි වීම යැයි කීම සාධාරණ ය. උත්පත්තියෙන් ඇති උරුමයක් ගැන කියමින්, යම් පවුල් හා ඊට සම්බන්ධ වූවන් දැයක් සතු සියලු ම ධනය තමන්ගේ පාලනයට ගැනීමත්, ඒ මඟින් අතිශයින් වැඩි කොටසකට ධනයට ඇති අයිතිය අහිමි කිරීමත් සිදු වී තිබෙන බව යම් කාලවල ජීවත් වූ ඇත්තෝ හඳුනා ගත්හ. මේ හොරකම හා හොරකමට ඇති ප්‍රවණතාව සීමා කළ හැක්කේ හෝ මුළුමනින් ම නැති කර දැමිය හැක්කේ තමන් විසින් හොඳින් හිතාමතා ඇති කර ගන්නා පාලන ක්‍රමයක් හා ඒ පාලන ක්‍රමයේ බලය දරන්නන් ද තමන් විසින් ම පත් කර ගනු ලැබීම යන කරුණු දෙක මත බව ය යන්න පිළිබඳ ව පළල් ව පිළිගැනුණු මතවාදයක් ඇති විය.

මා ජීවත් වූ කාලයේ වැඩි කොටසක් තුළ මේ මූලික අදහසට බලවත් සේ ගරු කිරීමක් පැවතියේ ය. පාලන ක්‍රමය හොරකමට ඉඩක් නැති එකක් බවට පත් කර ගැනීමත්, පාලකයා හොරකම හෙළාදකින හා හොරකම මර්දනය කිරීමට කැප වූවෙකු බවට පත් කර ගැනීමත් යන පරමාභිලාෂයන් ඒ සමාජය තුළ වැදගත් යයි සැලකූ අදහස් අතර ප්‍රධාන තැනක් ගත්තේ ය.

පාලකයා හොරෙක් වීම වැළැක්වීම සඳහා වැඩි දියුණු කර ගෙන තිබූ උපාය මාර්ගය වූයේ නීතියයි. ජනතාව සිය කැමැත්තෙන් නීති සාදාගන්නේ ඒ නීති මඟින් පොදු යහපතක් ඉටු කර ගැනීමට හැකිය යන විශ්වාසය මත ය. සංවාදශීලීත්වය පදනම් කොට ගෙන නීති ගොඩනඟා ගැනීමේ කර්තව්‍යයෙහි යෙදීමත්, නීතිය තුළ පාලකයන්ට හොරකම් කිරීමට ඇති ඉඩකඩ නැති කරමින් පාලකයා නීතියට යටත් කර ගැනීමත්ය යන ඒ මූලික අදහස් ඒ සමාජයේ පදනම ලෙස පැවතියේ ය. ඇමරිකානු ජාතික තෝමස් පේන් නමැති විශාල ප්‍රසිද්ධියක් දැරූ ලේඛකයා මෙය කෙටියෙන් සඳහන් කළේ මෙසේ ය. බ්‍රිතාන්‍යයට රජෙක් සිටී. අපේ (ඇමරිකාවේ) රජු නීතියයි. මේ සරල වාක්‍යය තුළ ශතවර්ෂ ගණනාවක් තුළ පරිණාමය වූ දේශපාලන දර්ශනයක් කැටි කළ උත්තරීතර අදහසක් සාරාංශ ගත විය. ඒ මූලික අදහස මා ජීවත් වූ කාලයේ ලංකාවේ දේශපාලන දර්ශනයේ කේන්ද්‍රීය තැනක් ගත්තේ ය.

එයට බද්ධ වූ තවත් අදහසක් විය. එනම් නීතිය කුමක් ද? එය ක්‍රියාත්මක විය යුත්තේ කෙසේ ද? යන ප්‍රශ්නවල දී අවසාන තීරණය අධිකරණය සතු විය යුතු බව ය. ඒ නිගමනයට ද සාධාරණ හේතුවක් තිබුණේ ය. ඒ හේතුව නම් ව්‍යවස්ථාදායකයත්, විධායකයත් යන දෙකම නියෝජනය කරන්නේ රටේ දේශපාලන නායකයන් වීම ය. ඒ නිසා රටේ නීතිය පිළිබඳ අවසාන තීන්දුව ඔවුන් සතු විය යුතු නැත. මන්ද යත් පාලකයන් බවට පත් වන දේශපාලඥයන් තුළ හොරකමට ඇති ප්‍රවණතාව ස්වභාවිකවම පවතින නිසා ය. අධිකරණය යනුවෙන් අදහස් කරන ලද්දේ බලපෑම්වලින් බොහෝ දුරට ඈත්වූ, වෘත්තීය වශයෙන් නීතිය හා ජනතාවකගේ ආරක්ෂාව සැලසීමට පමණක් ම කැප වූ කණ්ඩායමකි. ඔවුන් තෝරා පත් කර ගන්නා ක්‍රමය, ඔවුන් අනුගමනය කරන විනය ප්‍රතිපත්ති හා ඔවුන් ඉවත් කර ගත හැකි මාර්ග යන මූලෝපායන් ඔස්සේ අධිකරණයේ සාමාජිකයන් හොරකමින් වළක්වාගත හැකිය යන්න ඒ කාලයේ තරයේ විශ්වාස කරන ලද අදහස් අතර විය.

අධිකරණය ස්වාධීන විය යුත්තේ ඇයි ද යන්න ඉහත කී අදහස් තුළින් පැහැදිලි කළ හැකි ය. රටේ බලවත් ම සංස්ථාවන් වන ව්‍යවස්ථාදායකය හා විධායකය හොරකම් කිරීම හෝ වෙනත්

වැරදි කිරීම වළක්වාලීමට නම් අධිකරණයට ඒ කරුණුවල දී ඒ සංස්ථාවන් දෙක අභිභවා යන බලයක් තිබිය යුතු ය. එවැනි බලයකින් තොර ව පැවතිය හැකි ස්වාධීනත්වයක් නැත. ස්වාධීනත්වයක් නැති තැන සැබෑ අධිකරණයක් ද නැත. සැබෑ අධිකරණයක් නැති තැන සාධාරණ නීති පද්ධතියකට පැවතීමට ඉඩකඩක් ද නැත.

මා ක්‍රියාකාරී ව සිටි කාලයේ වැඩි කොටසක් තුළ ඒ අදහස් පිළිබඳ ව දැඩි පිළිගැනීමක් තිබුණේ ය.

එහෙත් ඒ ක්‍රියාකාරී කාලය අවසානයේ දී මා වැනි අයට දකින්නට සිදු වූයේ මේ මූලික අදහස් ටිකින් ටික යටපත් කරනු බලා සිටීමට ය. නීතිය යටපත් කිරීම සූක්ෂ්ම ව කරන ලදි. මහජන කැමැත්ත අව්‍යාජ සංවාදශීලීත්වයක් තුළින් ලබා නොගෙන පාලකයා ම තමා පාලනය කරන නීති ද නිර්මාණය කර ගන්නා තැනැත්තා බවට පත් විය. එවිට අනිවාර්යයෙන් ම සිද්ධවන්නේ තමන් වටා ඇති සීමාවන් ඉවත් කරවා ගෙන, කාටත් නොදැනෙන සේ බරපතළ ලෙස සොරකම් කිරීමට ඇති ඉඩකඩ පළල් කරවා ගැනීම ය. මෙය සිදු වනු බලා සිටීමට අපට සිදු විය.

නීතියේ ශක්තිය බිඳ දැමීම සඳහා අධිකරණයේ ශක්තිය ද යටපත් කිරීමට අවශ්‍ය විය. එය ද නීති මඟින් ම කරවා ගැනීමට පාලකයන්ට හැකි විය.

මේ ක්‍රියාවලියේ පටන්ගැන්ම අපගේ ජීවිතයේ අවසාන කාලය තුළ දකින විට අපට ඇති වූ බලවත් ම භීතිය වූයේ, මේ ක්‍රියාදාමය ටිකින් ටික තවදුරටත් පළල්ව ගිය පසු කුමන ආකාරයක තත්ත්වයක් ඊළඟ පරම්පරාවලට උරුම වේ ද යන්න පිළිබඳ ව ය.

ඔබ මෙහි දී මා නියෝජනය කරන ඒ අතීත පරම්පරාවෙන් මෙවැනි ප්‍රශ්නයක් අසන්නට පුළුවන. ඔබ ඉහත කී විනාශකාරී පරිවර්තනය සිදු වන අවස්ථාවේ දී, ඒ දෙස කම්පා වී බලා සිටීම හැර වෙන දෙයක් කිරීමට ඔබට පුළුවන් කමක් නැති වූයේ ඇයි? මෙවැනි විනාශයක් ඇති කිරීමට එරෙහි ව ජීවිතය පරදුවට

තබා හෝ සටන් කළ යුතු ව තිබුණේ නැද්ද? එවැනි සටනක් කොට හිරබත් කෑමට සිදු වුවත් එය ගෞරවනීය ඉරණමක් ලෙස දැකීමට ඔබට හෝ ඔබගේ කාලයේ සිටි අනෙක් අයට නොහැකි වූයේ ඇයි?

මෙය අතිශයින් ම සාධාරණ වන ප්‍රශ්න මාලාවකි. මේ ලියන මොහොත වන විට මම ද මේ ප්‍රශ්න මගෙන් ම නිතර නිතර අසා ගැනීමට නැඹුරු වී සිටිමි. මා තුළ ම මා ගැන ම වුවත් ඇති වී තිබෙන දෝෂාරෝපණය ඉතා බලවත් ය. අනාගතයේ දී මේ ප්‍රශ්නය කවදා හෝ බොහෝ දෙනෙකු අසන ප්‍රශ්නයක් බව මට සිතා ගත හැකි ය.

ඒ දෝෂාරෝපණ මධ්‍යයේ මාගේත් මා ජීවත් වූ පරම්පරාවේත් නිර්දෝෂී භාවය පෙන්වීම සඳහා මට කිව හැක්කක් නැත. උසාවියක් ඉදිරියේ අපරාධයක් පිළිගන්නා අපරාධකාරයෙකු මෙන් මම ද ඔබ කරන ඒ චෝදනාවලට වරදකරු බව පිළිගනිමි.

එසේ නොවන සේ යම් කිසි අභීත භාවයකින් මේ තත්ත්වයට මුහුණ දීමට අපේ පරම්පරාවට හැකි වූවා නම් මෙයින් පසුව එන පරම්පරාවල අනාගතය අඳුරු වීම වැළැක්විය හැකි ව තිබුණාය යන අදහස මතුව එන විට ඇතිවන්නේ කිව නොහැකි කනස්සල්ලකි.

මෙය කියනු හැර සාධනීය වූ කාලයක පටන් ගත් අපගේ ක්‍රියාකාරී ජීවිතවල අවසානය මෙතරම් ඍණාත්මක තැනකට පත් වූයේ කෙසේ ද යන්න මට ද වටහා ගත නොහැකි ය.

* * * *

# මංකොල්ලකරුවන්ගේ පාරාදීසයක්?

ඔබ මේ ලේඛනය කියවන කාලය වන විට ඔබ ජීවත් වන දැය බොහෝ දුරට මංකොල්ලකරුවන්ගේ පාරාදීසයක් බවට පත් වී තිබෙනු ඇත යන්න, මා මින් ඉහත කියන ලද කරුණු අනුව නොවැළැක්විය හැකි නිගමනයකි.

පාලකයා ස්වභාවයෙන් ම පාලනයෙන් අයුතු ප්‍රයෝජන ගැනීමට පෙලඹෙන නිසා, පාලන බලය අත ඇති සියල්ලන් ම බැඳ තිබිය යුතු බව ලෝකය පුරා පිළිගත් නියාමයකි. බලය බැඳ තැබීම පිළිබඳ සංකල්පය අපගේ ජන වහරේ එන යකා බැඳ තැබීම පිළිබඳ අදහසට සමාන ය. බැඳුම් කඩා ගත් යක්ෂයා කුමන විනාශයක් කරාවි ද යන්න හිතාගන්නට බැරිතරම් දෙයකි. බැඳුම් කඩා ගත් පාලකයා ද එවැනි තත්ත්වයක සිටින අයෙකි.

පාලකයා බැඳ තැබීම යන්නෙහි අර්ථය වූයේ, පාලකයාගේ බලය සීමා කරන නීතීන් පැවතිය යුතුවා පමණක් නොව, ඒ සීමාවන් ක්‍රියාත්මක කරවා ගැනීමේ ශක්තිය යම් සමාජයක පාලන තන්ත්‍රය තුළ ම තිබිය යුතු ය. ඒ හැකියාව රැඳෙන්නේ ඒ රටෙහි සාධාරණ නීති පද්ධතියක් පැවතීම හා ඒ නීති පද්ධතිය ක්‍රියාවට නැඟිය හැකි යුක්තිය පසිඳලීමේ සංස්ථාවන් පැවතීම මඟිනි.

යුක්තිය පසිඳලීමේ සංස්ථාවන් යනුවෙන් වර්තමාන ලෝකය හඳුන්වන්නේ, රටේ අපරාධ පරීක්ෂණ කිරීමේ හා අපරාධ වැළැක්වීමේ ශක්තිය ඇති සිවිල් පොලිස් සංවිධානය ද, අපරාධයට විරුද්ධ ව අපක්ෂපාතී ව හා ස්වාධීන ව නඩු පැවරීමේ බලයක් ඇති රජයේ නඩු පවරන්නාගේ කාර්යය (නීතිපති ක්‍රමය වැනි) සංස්ථාව ද නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමේ හැකියාව

හා එසේ කිරීමට බලය ඇති අධිකරණය හා බන්ධනාගාර සංස්ථා තුළිනි. මේවා නිර්මාණය වූයේ හුදෙක් රටවැසියා කරන අපරාධ වැළැක්වීම සඳහා පමණක් නොව, පාලකයන් කරන වැරදිවලට ද දඬුවම් කර, පාලකයා පාලනය කර ගැනීම සඳහා ය.

නීතියේ මේ යදම්වලින් පාලකයෙක් අත්මිදුණහොත් ඔහු ද බැඳුම් කඩා ගත් යක්ෂයෙකුගේ තත්ත්වයට පත් වෙයි. ඔහුගේ වැඩිම ඉලක්කය වන්නේ රටවැසියාගේ සියලු ම දේපළ හා ධනය තමන්ගේ වාසිය සඳහා මංකොල්ලකා ගැනීම ය.

පාලකයා මංකොල්ලකරුවෙකු වීම වළක්වා ගැනීමට බැරි සමාජය මංකොල්ලකරුවන්ගේ පාරාදීසයක් බවට පත් වීම වැළැක්විය නොහැකි ය.

මා මේ වදන් ලියා තබන්නේ මෙය කියවන ඔබට ඔබ ජීවත් වන වාතාවරණය පිළිබඳ යම් අවබෝධයක් ඇති කර ලීම සඳහා ය. හුදෙක් දූෂණයේ ඇති වීම හා පැතිරීම පිළිබඳ ව දොස් කීම තුළින් පාලකයා තුළ මංකොල්ලකෑමට ඇති ප්‍රවණතාව නැති කළ නොහැකි ය. එසේ නැති කළ හැකි එකම යදම වන්නේ නීතිය හා නීතිය ක්‍රියාත්මක කරවා ගැනීමට යම් සමාජයකට හැකි වීම මත ම පමණ ය.

මේ තුළින් මතුවන්නේ ඔබ ජීවත් වන වාතාවරණය පදනම් වී ඇති දෙබිඩියාව ය. එක් අතකින් ඔබ පත් වී ඇති ව්‍යසන තත්ත්වය ඔබගේ නිර්මාණයක් නොවේ. එය ඔබට පෙර ජීවත් වූ අයගේ දුර්වලකම් හා සීමාසහිත කම් තුළින් පැන නැඟේ. අනෙක් අතට ඒ තත්ත්වය නිසා ඔබ සතු සියල්ල ම පැහැර ගන්නා මංකොල්ලකරුවන්ගෙන් බේරෙන ක්‍රමය සොයා ගැනීම ද පැවරී ඇත්තේ ඔබට ම ය.

මේ ඇත්තෙන් ම ඛේදනීය තත්ත්වයකි. ඔබ මුහුණ දෙන තත්ත්වය නිර්මාණය කර ගත්තේ ඔබ ම නොවේ. එහෙත් ඒ තත්ත්වයේ අනිසි ප්‍රතිඵල භුක්ති විඳින්නට සිදුවන්නේ ඔබට ය.

දෛවයේ මේ සරදමින් බේරී සිටීමට ඔබට ක්‍රමයක් නැත.

මා මෙසේ කියන්නේ අනාගත ව්‍යසනයක් පිළිබඳ ව පේන කීමෙන් කිසියම් තෘප්තියක් ලබා ගැනීම සඳහා නොවේ. ඇත්ත

ඇති සැටියෙන් කීමෙන් වැළකී සිටීමට නොහැකි තත්ත්වයකට මා පත් වී සිටින නිසා ය. සමහර විට මා වැන්නන්ගෙන් යම් ආකාරයක සේවයක් අනාගතයට වේ නම් එසේ විය හැක්කේ අප දකින සත්‍යය නිර්දය ලෙස ප්‍රකාශයට පත් කිරීම තුළින් පමණ ය.

ඉතිහාසයේ අඳුරු ම කාලයන් තුළ දී, යම් ආකාරයක අමුතු කල්පනා ධාරාවක් යම් දැයක ජීවත් වන මිනිසුන් තුළ ඇතිවීමට ඉඩ ඇත. තමන් මුහුණ දෙන ව්‍යසනය පිළිබඳ ඇති ගැඹුරු අවබෝධය නිසා ම, ඒ තත්ත්වයෙන් බේරී වෙනස් අනාගතයක් ගොඩනගා ගැනීමේ මූලෝපායන් හා ක්‍රමවේදයන් සෙවීමේ උවමනාවක් ඇතිවීමට ඇති ඉඩකඩ බොහෝ ය. එක අතකින් මංකොල්ල කරුවන්ගේ පාරාදීසයක් වීම තුළින් තව තවත් ව්‍යසනයට යැමත්, අනෙක් අතින් තමන් මුහුණ දෙන ගැටලුව පිළිබඳ ගැඹුරු අවබෝධයක් තුළින් වර්තමානයට හා අනාගතයට මුහුණ දීමට නව මාවත් සොයා ගැනීමත් යන දෙක අතර ඔබගේ ඉරණම ලියවී ඇත.

මාගේ හිතවත් අනාගත පාඨකය, ඔබගේ හිත සනසා ලීමට කිසිවක් කීමට මට නොහැකි වීම ගැන උරණ නොවන්න. මා සනසා ගැනීමටත් කිසිවක් කීමට නොහැකි තත්ත්වයක මම පසුවෙමි.

ඔබගේ අනාගත ගැලවුම්කාරයා විය හැක්කේ ඔබට ම පමණ ය.

මේ නිසාවට ම ඔබ ඉදිරියේ ඇති ගැටලු ඇති සැටියෙන් ම හඳුනා ගැනීම අවශ්‍ය වේ.

මා ඉහත සඳහන් කළ ගැටලුවලට අමතර ව, ඔබට මුහුණ දීමට සිදු වන තවත් ගැටලුවක් මම දකිමි. ඒ ගැටලුව පැන නඟින්නේ සමාජ ව්‍යසන කාලයක් පැවතුණු පසු, එය අපේ සිතීමට හා කථාවට මාධ්‍ය වන භාෂාවල් කෙරෙහි ඇති කරන බලපෑමයි. සමාජ ව්‍යසනයක් තුළින් අරුත් වියවුල් කිරීම් හා නොපිට හැරවීම් සිදු වේ.

# අරුත් වියවුල් කරන භාෂා අවුල

රටක මතභේද උග්‍ර කිරීමේ හෝ බොහෝ දුරට මතභේද සමහන් කරමින් ඒවා විසඳීම සඳහා හවුල් වීමට භාෂාවකට පුළුවන. මෙය සිදුවන්නේ භාෂාව තුළින් කියවෙන වචනවල අරුත් කොපමණ දුරකට මහජන චින්තනයේ ප්‍රකාශයට පත් වේ ද යන කරුණ මත ය. භාෂාව මඟින් ඉතා පැහැදිලි භාෂාවේ වචන මඟින් ඉතා පැහැදිලි අරුත් ප්‍රකාශයට පත්වන්නේ නම් ඒ අරුත් පිළිබඳ පැහැදිලි සාකච්ඡාවක් කර ගෙන යෑමට මහජනතාවට හැකි වේ. එහෙත් වචන මඟින් කියවෙන අරුත් නොපැහැදිලි හෝ පරස්පර විරෝධී ඒවා නම් ඒ නිසාවටම සමාජය තුළ සුහද සාකච්ඡාවක් පවත්වා ගෙන යෑමට නොහැකි වන අතර, බොහෝ විට ඉතා බරපතළ මතභේද මතුවන්නට ඉඩ කඩ ඇත.

ඉහත සඳහන් අදහස වඩා පැහැදිලි ව තේරුම් කර ගැනීම සඳහා අප කතා කරන සමහර වචන හා ඒවායෙන් වර්තමානයේ දී කියවෙන අරුත් පිළිබඳ ව මඳක් විමසා බලමු. අපි 'පොලීසිය' යන වචනය පාවිච්චි වන ආකාරය දෙස බලමු. සාමාන්‍යයෙන් පොලිසිය හෝ පොලිස් නිලධාරියෙකු යන වචනය ප්‍රකාශයට පත් වූ විට එයින් බලාපොරොත්තු වන්නේ සාමය ඇති කිරීමට වෙහෙසෙන, නීතිය ක්‍රියාත්මක කිරීමට කැප වුණු ආයතනයක් හා පුද්ගලයන් ය. එහෙත් ලාංකිකයෙකු මේ වචන අසනවාත් සමඟ ම ඔහු තුළ ඇතිවන්නේ මේ අදහස ද? පොලිසිය ආයතනයක් ලෙස නම් කළ විට ඒ තුළින් ජනනය වන අදහස් නම් අකර්මණ්‍යතාව, නොසැලකිල්ල හා හිරිහැර කිරීම ආදි අරුත් වන අතර, 'පොලිස් නිලධාරී' යන්න සඳහන් කළ විට ඒ වචනයෙන් ජනනය වන අදහස නීතිය නොතකන, නීතිය යොදා ගෙන විවිධ හොරකම්වල යෙදෙන හා ජනතාවට හිරිහැර කරන අයෙකුය යන්නයි.

'වෛද්‍යවරයා' යන වචනය සාමාන්‍යයෙන් ජනනය කළ යුත්තේ සෞඛ්‍ය සේවයට කැප වුණු, රෝගීන් සුවපත් කිරීම සඳහා වෙහෙසෙන වෘත්තිකයෙකු යන අදහස ය. එහෙත් ලංකාවේ මේ වචනය පාවිච්චි කිරීමත් සමඟ ම එකවිට ම ප්‍රකාශයට පත් වන අදහස් වන්නේ සේවාදායකයන් වෙනුවෙන් කාලය මිඩංගු නොකරන, ඉතා ම සුළු කාලයක් තුළ විශාල ධනයක් ඉපදවීමට වෙර දරන, බොහෝ විට ඔවුන් දෙන ප්‍රතිකාර සම්බන්ධයෙන් වගකීමක් නැති වෘත්තියක් යන අදහස් ජනනය වෙයි.

'ගුරුවරයා' යන වචනයෙන් කියවිය යුතු අර්ථය වන්නේ අධ්‍යාපනය සඳහා කැප වුණු සිසුන්ගේ සුබසාධනය සඳහා වෙහෙසෙන, අතිශයින් හික්මීමක් ඇති තැනැත්තෙකු හෝ තැනැත්තියක් ය. එහෙත් අද ලංකාවේ ගුරුවරයා යන වචනයෙන් බොහෝ දුරට කියවෙන්නේ වෘත්තිකයෙකුට සුදුසු වැටුපක් නොලබන, බොහෝ විට පාසල් කාලය තුළ දී වෙනත් ක්‍රියාවල යෙදෙන, ශිෂ්‍යයන්ගේ සුබසාධනයන් පිළිබඳ වගකීමක් භාර නොගන්නා පුද්ගලයෙකි. මේ අදහස්වල ප්‍රතිඵලය දැකිය හැක්කේ විශාල වශයෙන් ටියුෂන් පන්ති කරා දරුවන් යවන පුරුද්ද පතළ ව තිබීම තුළිනි.

'විනය' යන වචනය සාමාන්‍යයෙන් ජනනය කරන්නේ කිසියම් රීතීන්ට අනුව වැඩකටයුතුවල යෙදෙන හා කිසියම් පිළිවෙළක් අනුගමනය කරන අනුකරණයට සුදුසු අයවලුන් සම්බන්ධයෙනි. එහෙත් වර්තමාන ලංකාවේ විනය පිළිබඳ වචනය කියවනවාත් සමඟ ම ජනනය වන අදහස නම් විනයක් නැතිකමත්, විනය යන්න විහිළුවක් සේ සැලකීමත්, විනයට වඩා විනය කැඩීම තුළින් දියුණුවීමට ඇති ඉඩකඩ පිළිබඳ අදහසුත් ආදි සංකල්පයන් ය.

'නීතිය' යන්නෙන් සාමාන්‍යයෙන් කියවිය යුතු වන්නේ රටක සාමය, විනය හා සමාජ සම්බන්ධතාවල් සාධනීයව පවත්වා ගෙන යෑමට ඇති වාතාවරණයයි. එහෙත් නීතිය යන වචනය ඇසෙනවාත් සමඟ ම ජනනය වන සංකල්පය නම් රටේ නීතියක් නැති බවත්, නීතිය කැඩීම ලාබදායී දෙයක්ය බවත්, නීතිය අනුගමනය කිරීමට යෑමෙන් අමාරුවේ වැටෙන බවත්,

නීතියට ගරු නොකරන්නා ඉහළ තත්ත්වයට පත් වන බවත් ආදි සංකල්පයන් ය. මේ ආකාරයෙන් දීර්ඝ වචන මාලාවක් ඉදිරිපත් කළ හැකි ය. එහෙත් වඩා වැදගත් වන්නේ යම් වචනයක් තුළින් සමාජයීය වශයෙන් සාධනය වන වචනයට සමාජීය වශයෙන් සාධනීය නොවන දෙයක් ප්‍රකාශයට පත්වීමත් සමඟ ම එයින් ඇති වන විශාල ප්‍රතිඵලයන් සම්බන්ධයෙනි. මෙහි ප්‍රතිඵලය වන්නේ කිසියම් හෝ මාතෘකාවක් හෝ තේමාවක් සම්බන්ධයෙන් සාකච්ඡාවක් කර ගෙන යෑමට ඇති ඉඩකඩ බොහෝ සේ භාෂාව තුළින් ම හා භාෂාවට ප්‍රතික්‍රියා දක්වන මානසික තත්ත්වයන් තුළින් ම ජනනය වීමයි. මේ නිසා යම් කථිකයෙකු යම් සාධනීය අරමුණක් ඇති ව කිසියම් වචන මාලාවක් පාවිච්චි කරයි නම් ඔහුට සමාජයෙන් ලැබෙන ප්‍රතික්‍රියාව වන්නේ ඔහු සමාජ යථාර්ථය අවබෝධ කර නොගත්තෙක් ලෙස හෝ කිසියම් වංචනික අදහසකින් සැබෑ තත්වය යටපත් කරමින් වඩා සාධනීය තත්ත්වයක් මතුකිරීමට උත්සාහ කරන පුද්ගලයෙකි යන අදහස ය.

මේ තත්ත්වය තුළින් ඉතාමත් ම ගැඹුරු වූ සමාජ ගැටලු ඇති කළ හැකි ය. මන්ද යත් සාමාන්‍යයෙන් සමාජ ගැටලු නිරාකරණය කිරීම සඳහා යොදා ගන්නා උපකරණය වන්නේ භාෂාව නිසා ය. කිසියම් පැහැදිලි අරුත් මාලාවක් කියවෙන වචන පාවිච්චි කිරීම තුළින් එසේ පාවිච්චි කරන්නා, ඒවා අසා සිටින්නා තුළ කිසියම් පොදු අදහසක් ජනනය කරයි. මේ පොදු අදහස පිළිගත හැකි ද? නොහැකි ද? යන්න පිළිබඳ ව විවිධ මතභේද පැවතිය හැකි ය. මේ මතභේද සාධනීය පදනමක සාකච්ඡා වන්නේ නම් එය තුළින් සිදුවන්නේ වඩා පුළුල් අවබෝධයක් ජනතාවක් තුළ නිර්මාණය වීමයි. භාෂාවක අරුත් වියවුල් වූ පසු එයින් සිදුවන්නේ ඊට හාත්පසින්ම වෙනස් සිදුවීමක් වන අතර, එහි ප්‍රතිඵල ද හාත්පසින්ම වෙනස් වේ. සමාජය තුළ ගැටලු, හිංසාකාරී තත්ත්වයන් මෙන් ම වියවුල් බව කිරීමටත් භාෂාව උපකරණයක් බවට පත් විය හැකි ය.

බයිබලයේ මේ තත්ත්වය විස්තර කර ඇත්තේ 'බාබෙල්' නමැති විශාල කුලුනක් සම්බන්ධයෙනි. මෙහි කියවෙන්නේ එකම භාෂාවක් කතා කරමින් සිටි මිනිසුන් කණ්ඩායමක් හිටි

හැටියේ විවිධ භාෂාවලින් කතා කිරීමට පටන් ගත් අතර, මේ නිසා ඔවුන් අතර සමගියක් පවත්වා ගෙන යෑමට නොහැකි වූ ආකාරය ය. එකම භාෂාවකින් එකිනෙකට හාත්පසින් වෙනස් අදහස් ප්‍රකාශයට පත් වීම තුළින් ද කෙරෙනුයේ විවිධ භාෂාවලින් කතා කිරීමට සමාන තත්ත්වයකි.

මෙවැනි තත්ත්වයක් යම් සමාජයක් තුළ උදා වූ පසු ඒ සමාජයෙහි මොනයම් හෝ ප්‍රශ්නයක් නිරාකරණය කිරීමට යන විට භාෂාව ඊට ප්‍රධාන ප්‍රශ්නයක් වේ. අද ලංකාව තුළ පවතින ගැටලුවක් වී ඇත්තේත් මෙයයි.



ගිනි කන්දකට සමාන සමාජ ව්‍යසනයකට අපි මුහුණපා සිටිමු. එය යම්තමින් ප්‍රකාශයට පත් වන අවස්ථාවේ දී, එය මඟහරවා ගත හැකි යැයි සමහරු සිතූහ. මා ද තරමකට එසේ සිතූ බව කීමට මැළි නොවෙමි. එහෙත් ක්‍රමයෙන් ගිනි කන්ද පුපුරා ගියේ ය. අද හෙට එය නිවී ඉවර වනු ඇතැයි සමහරුනට හිතුණොත් එය ද ස්වභාවික ය. එහෙත් ගිනි කන්දක ස්වභාවය දන්නෝ එවැනි වෙනසක් ඉක්මනින් සිදු නොවනු ඇති බව හොඳින් දනිති.

ISBN 978-955-691-205-0

9 789556 912050

200/=

විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය